2018

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය

வரையறுக்கப்பட்ட தொலைக் கல்வி நிலையம

Distance Learning Centre

State Owned Institute Under
Ministry of Public Administration

DLC
Distance Learning Centre Ltd.
Connecting Minds

GLOBAL
DEVELOPMENT
LEARNING
NETWORK
GDLN

පටුන

සභාපතිතුමියගේ සමාලෝචනය 2

ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ වාර්තාව 3

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය පිළිබඳ කෙටියෙන් 4

දැක්ම හා මෙහෙවර 6

සංස්ථානික තොරතුරු 7

අධ්‍යක්ෂ මණ්ඩලය 8

මානව සම්පත් 10

භෞතික සම්පත් 12

නිෂ්පාදන හා සේවා 13

2018 වසරේ පවත්වන ලද ප්‍රධාන පුහුණු වැඩසටහන් 14

මූල්‍යමය වශයෙන් වැදගත් කරුණු 17

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 18

විගණන කමිටු වාර්තාව 21

බාහිර විගණක වාර්තාව 22

මූල්‍ය ප්‍රකාශ 27

වාර්ෂික මහා සභා දැන්වීම 53

පෙරකලාසි ආකෘති පත්‍රය 54

සභාපතිතුමියගේ සමාලෝචනය



වසන්තා පෙරේරා

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2018 දෙසැම්බර් 31 වන දිනට අවසන් වන වර්ෂය සඳහා විගණනය කළ ගිණුම් සහ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරනුයේ හද පිරි සතුටිනි.

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය නැවත වතාවක් එහි පසුගිය වසර තුන තුළ දක්වන ලද ප්‍රබල වර්ධන ප්‍රවණතාවෙහි අග්‍රස්ථානයට පත්වෙමින් සාර්ථක අන්දමින් ඉහළ යන ලාභ වාර්තා කර තිබේ. 2018 වර්ෂය වනාහී සමාගමේ සියලුම අංශයන්හි ඉහළ මට්ටමේ කාර්යසාධනයක් පවත්වා ගනු ලැබූ හොඳම වර්ෂයකි. දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය අධ්‍යාපනය හා තොරතුරු තාක්ෂණය වැනි අංශයන්හි ජාතික වැදගත්කමින් යුත් ව්‍යාපෘතීන්හිවිශිෂ්ට අන්දමින් අඛණ්ඩව නියැලී තිබේ.

ආයතනයේ අරමුණෙහි හා බලපෑමෙහි පැහැදිලි බව සහ ආයතනයට යාමට අවශ්‍ය වුණු ගමන සම්බන්ධයෙන් දිගු කාලීන දැක්මක් ඇතිව කටයුතු කිරීම දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය පසුගිය වසර තුන තුළ අඛණ්ඩව අත් කරගත් සාර්ථකත්වයට හේතු වූ බව අවධානයට ගැනීම වැදගත් වේ.

ගෝලීය සංවර්ධන ඉගෙනුම් ජාලයට අනුබද්ධ ජාත්‍යන්තර ආයතන සමග හඳුනාගනු ලැබූ නව ව්‍යාපෘති වනාහී දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයට උපායමාර්ගික වශයෙන් වැදගත් වන තවත් අංශයකි. ගෝලීය සංවර්ධන ඉගෙනුම් ජාලය විසින් ලෝක බැංකු අරමුදලින් ක්‍රියාත්මක වන එහි ආසියා පැසිෆික් ලේකම් කාර්යාලය පවත්වාගෙන යාමේ කර්තව්‍යය නැවත වතාවක් දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය වෙත පවරන ලදී. එයට අමතරව, ශ්‍රී ලංකාව තුළ ලෝක බැංකුවේ මෙහෙයුම් අරමුණු සැපිරිය හැකි විශ්වසනීය හවුල්කරුවෙකු වශයෙන් දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ තත්ත්වය ශක්තිමත් කරමින් ලෝක බැංකුව විසින් එහි අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ ප්‍රහුණු සංරචකය ඒ වෙත ප්‍රදානය කරන ලදී. සංවිධානය තුළ කැපී පෙනෙන වෙනස සහ එය ව්‍යාපාර සිදු කරගෙන යන ආකාරය පළාත්, ජාතික සහ ජාත්‍යන්තර මට්ටම්වලින් නව සහයෝගීතාවන්ට මං විවර කරන ලදී.

වීඩියෝ සම්මන්ත්‍රණ ක්‍රමය හරහා මානව සම්පත් සංවර්ධනයේ නවතම චින්තනය ගෙන ඒම ඉලක්ක කොට දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය කටයුතු කරයි. ඩිජිටල් තාක්ෂණයේ මෑත කාලීන වෙනස්කම් තුළින් ආයතනයේ අභ්‍යන්තර ධාරිතාවන් හා ආයතනය මගින් සැපයෙන සේවාවන් සම්පූර්ණ වෙනස්කමකට භාජනය කරමින්තාක්ෂණයේ නව ප්‍රවණතා ඇතුළත් කරගැනීම මෙම ආයතනයේ අවශ්‍යතාව වේ.ගෝලීය සංවර්ධන ඉගෙනුම් ජාලය සඳහා වන වීඩියෝ සම්මන්ත්‍රණ ක්‍රියාකාරකම් වෙනුවෙන් දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය cloud based තාක්ෂණය භාවිතා කිරීම සිදු කළ 2017 වසරේදී මෙම ගමන ආරම්භ විය. 2018 වසර මුළුල්ලේද අඛණ්ඩව සිදු කෙරුණු මෙම කාර්යය ඉදිරි වසරවලදීද සිදු කෙරෙණු ඇත.මෙම වෙනස්කම් තුළින් දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය පෙන්නුම් කරනුයේ සේවා අපේක්ෂාවන් අභිබවා යමින් තම සේවාලාභීන් වෙත ගුණාත්මක බවින් ඉහළ සේවාවක් ලබාදීම සඳහා නව තාක්ෂණයන් හා අනුගත වී ඉන් උපරිම ප්‍රයෝජන ගැනීමට එයට ඇති හැකියාවයි

අවසාන වශයෙන්, 2018 වසරේදී ඉතා ඉහළ මට්ටමේ ප්‍රශංසනීය කාර්යසාධනයක් අත්කර ගැනීම වෙනුවෙන් දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට සහ කළමනාකාරීත්වයට මාගේ ස්තුතිය පළකර සිටින අතර ඉදිරි වසරවලදී මෙයටත් වඩා ඉහළ ප්‍රතිඵල අත්කර ගැනීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරමි.

වසන්තා පෙරේරා

සභාපති, දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය

කොළඹ, ශ්‍රී ලංකාව

ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ වාර්තාව

ගර්ෂෝන් අරුලානන්දම්



මෙම වසර වනාහී දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් ඉහළවර්ෂ අවසාන ලාභ වාර්තා කරන ලද තවත් වසරකි. දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය,එමගින් පවත්වනු ලබන වැඩසටහන් පවත්වන වාර ගණන ඉහළ දමමින් ඉහළ වටිනාකමින් යුත් උපායමාර්ගික හවුල්කරුවන් සමග සහයෝගීත්වයෙන් වර්ෂය මුළුල්ලේ සිදු කළ වර්නණීය කටයුතු හේතුවෙන් සමස්තයක් වශයෙන් ඉහළ ලාභ වාර්තා කිරීමට සමත් වී ඇත.

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් ලෝක බැංකු ව්‍යාපෘතියක් තුළින් ගෝලීය සංවර්ධන ඉගෙනුම් ජාලය සමග වන සහයෝගීතාව ඉදිරියටත් පවත්වාගෙන යන ලදී. ගෝලීය සංවර්ධන ඉගෙනුම් ජාලයේ කලාපීය ලේකම් කාර්යාලය යළිත් වතාවක් 2018 වසර තුළද පවත්වාගෙන යාමට දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය වෙත පවරන ලදී.

රාජ්‍ය හා පෞද්ගලික අංශ වෙත නවතම චින්තනය ගෙන ඒම මගින් මානව ධාරිතා සංවර්ධනයේ පෙර නොවූ විරූ අවස්ථා උදා කිරීමේ බලය හිමි කර දෙමින් දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය පිහිටුවන ලදී. ඒ අනුව යමින්, අධ්‍යාපන අංශයේ පුහුණු වැඩසටහන පළාත් වෙතද පුළුල් කරන ලදී.'පන්තිකාමර තුළ ඉගැන්වීම්' තුළ ධාරිත සංවර්ධනයන් සිදුකිරීමේ සමස්ත අරමුණ පෙරදැරිව වයඹ පළාතේ පමණක් විදුහල්පතිවරුන් කණ්ඩායම් 30කට අධික ප්‍රමාණයක් දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් පුහුණු කරන ලදී.අනාගතයේදී අනෙකුත් පළාත් තුළද අධ්‍යාපන අංශ වෙත එවැනි පුහුණු වැඩසටහන් ගෙන යාම දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ ඉලක්කය වී තිබේ.

සංස්ථා සහ රාජ්‍ය ව්‍යාපාර වෙත කාර්ය මණ්ඩල විනය ක්‍රියා පරිපාටි පිළිබඳ පුහුණුව ලබාදීම වනාහී ප්‍රථම වතාවට සිදු කරන ලද තවත් කර්තව්‍යයකි.මෙම වර්ෂය තුළදී වැඩමුළු මාලාවක් තුළින් රාජ්‍ය අංශයේ විවිධ සංවිධානවල කාර්ය මණ්ඩල සාමාජිකයින් 500 කට අධික පිරිසක් පුහුණු කරන ලද අතර එමගින් දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය රාජ්‍ය අංශයේ බොහෝ ව්‍යවසායන් සඳහා විශ්වසනීය පුහුණු හවුල්කරුවෙකු වශයෙන් තහවුරු වන ලදී.

ඉහත ව්‍යාපෘතීන්වලින් ලත් ආදායමට අමතරව, දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය එහි පහසුකම් වෙන්කරදීම මෙන්ම වීඩියෝ සම්මන්ත්‍රණ පැවැත්වීම තුළින් ලැබෙන ආදායමද ඉහළ නංවාගැනීමට සමත්ව ඇත. මාර්ගගත (online) විභාග තුළින්ද ඉතා හොඳ ආදායමක් ආයතනයට ලැබුණු අතර විභාග පවත්වන ආයතන තුනක් එයට අලුතින් එක්වීමද සිදුවිය. ඉතා ඉහළ තාක්ෂණික හා විභාග පරිපාලන හැකියාවන්ගෙන් යුත් කාර්ය මණ්ඩලයක් දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය සතු වන බැවින් සෑම වසරකම සපයනු ලබන විභාග සංඛ්‍යාව වර්ධනය කරගැනීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ආයතනයේ හවුල්කාර සේවාලාභීන්ගේ දැඩි පුහුණු අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරමින් වෙහෙස නොබලා කටයුතු කරන දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ සේවක කණ්ඩායමේ ප්‍රයත්නයන් සහ නිරන්තරයෙන් අගය ඉහළ නැංවීම සඳහා ඔවුන් තුළ වන දැඩි අධිෂ්ඨානය දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ ඉහළ කාර්ය සාධනය කෙරෙහි පාදක වී තිබේ.බෙහෙවින් අභියෝගාත්මක වූ 2019 වසරට පා තබන අපි අපගේ වටිනාකම් සහ සේවාලාභී ප්‍රවණතා මගින් මෙහෙයවනු ලබන්නාවූද නව්‍යකරණය වෙතින් මග පෙන්වීම ලබන්නා වූද සංවිධානයක් වීමට අප තුළ වන තිර අධිටන හා දැඩි සේ එල්බ කටයුතු කටයුතු කරමු. මේ සියල්ල වෙතින් අපි අරමුණු කරණුයේ අප විසින් සේවය සපයනු ලබන්නා වූ පුද්ගලයින් සහ කණ්ඩායම් සඳහා පෙර නොවූ විරූ අවස්ථා නිර්මාණය කර දීමයි.

ගර්ෂෝන් අරුලානන්දම්
ප්‍රධාන විධායක නිලධාරී, දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය
කොළඹ, ශ්‍රී ලංකාව

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය පිළිබඳ කෙටියෙන්

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය යනු ශ්‍රී ලංකා රජය විසින්, ලෝක මට්ටමේ හොඳම පරිචයන් සමග අනුගත වෙමින් රජයේ හා පුද්ගලික අංශයේ පිරිස්වල ධාරිතා සංවර්ධනය ඇති කිරීම සඳහා 2002 වසරේදී ස්ථාපිත කරන ලද පුහුණු ආයතනයකි. පසුගිය වසර කිහිපය තුළලෝක බැංකු ආයතනයේ ගෝලීය සංවර්ධන ඉගෙනුම් ජාලයේ සහාය ද සහිතව දේශීය මෙන්ම විදේශීය සම්පත් දායකයන්ගේ සහභාගීත්වය ලබාගනිමින් එම පිරිස්වල අධ්‍යාපන හා වෘත්තීය දැනුමත් හැකියාවත් යාවත් කරමින් ඔවුන් සංවර්ධනය කිරීමට දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයට හැකි විය. දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ පුහුණු කටයුතු සාම්ප්‍රදායික චින්තනයෙන් බැහැරව සිදු කෙරෙන අතර පුහුණුවන්නන් සංවර්ධනයට මෙන්ම ඔවුන්ගේ කාර්ය සාධනය ප්‍රශස්ත කිරීමටද ඉවහල් වේ.

පසුගිය වසර ගණනාව මුළුල්ලේ දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය සාම්ප්‍රදායිකව දැනුම ලබාදීම වෙනුවට අවශ්‍ය අංශ වෙත ඉල්ලුම මත පදනම් වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි. ව්‍යාපාරික පරිසරයේ වෙනස් වෙමින් පවතින වත්මන් සන්දර්භය දෙස අවධානය යොමු කළ දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය, පාරිභෝගිකයින් ඉලක්ක කොටගත් ප්‍රවේශයක් භාවිතා කරමින් විශේෂිත වැඩසටහන් සංවර්ධනය කොට තිබේ.මෙම නව දිශානතිය සමග, තම සේවාලාභීන් වෙත ගුණාත්මක බවින් ඉහළ සේවාවන් සැපයීමට දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයට හැකි විය.එහි ප්‍රතිඵලයක් වශයෙන්, පෙර වසර හා සසඳන විට සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ බදු වලට පෙර ශුද්ධ ලාභය වර්ධනය වී ඇත. එය වනාහී,ආයතනයේ වියදම 2017 වසරේදී රු.මි. 29.1 සිට 2018 වසරේදී රු.මි. 21.5 දක්වා පහත දැමීම සඳහා (2වගුව) දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය ගත් අඛණ්ඩ ප්‍රයත්නයන් පැහැදිලිව නිරූපණය වන්නකි. එහි ප්‍රතිඵලයක් වශයෙන් බදු වලට පෙර ශුද්ධ ලාභය 2017 වසරේදී රු.මි. 14.1 සිට 2018 වසරේදී රු.මි. 15.1 දක්වා සුළු වර්ධනයක් පෙන්නුම් කරයි. බදු වලට පෙර ශුද්ධ ලාභයේ මෙම සුළු වර්ධනය ශේෂ පත්‍ර අයිතම දෙකක සිදු කරන ලද ගැලපුම් ආශ්‍රිතව සිදු වූ බව සඳහන් කළ යුතුය. ඒවා නම්; වසර ගණනක් තිස්සේ සිදුව ඇති වෙනස්කම් නිරූපණය වන සේ ගලපන ලද කුලී ක්‍රමක්ෂය සහ ආපසු ගෙවන ලද ආදායම් බදුවලින් කොටසක් උපලබ්ධි වීමේ අවදානම අවම කිරීම සඳහා පියවීම වේ. කෙසේවුවද දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය එහි උපායමාර්ගික ඉලක්ක වෙතින් ලබන පැහැදිලි මගපෙන්වීම තුළින් ඉදිරි වර්ෂ තුළදීද කාර්ය සාධනයේ මෙම ප්‍රවණතාව ඉදිරියටද පවත්වාගෙන යනු ඇත


පසුගිය වසර 5 තුළ සමාගමේ කාර්යසාධනය

1 වගුව–බදු වලට පෙර ශුද්ධ ලාභය (රු)

	2014	2015	2016	2017	2018
මුළු ආදායම(මූල්‍ය ආදායම ඇතුළුව)	34,262,954	40,428,238	48,599,370	69,671,388	67,769,778
මුළු වියදම	30,933,905	33,881,823	40,757,451	55,552,355	52,651,915
ආදායම් බදුවලට පෙර ලාභය	**3,329,049**	**6,546,415**	**7,841,919**	**14,119,033**	**15,117,863**

2 වගුව – දළ ලාභය (රු)

	2014	2015	2016	2017	2018
ප්‍රධාන මෙහෙයුම්වලින් ආදායම	29,374,573	36,673,859	44,262,033	62,953,972	59,779,244
විකුණුම් පිරිවැය	10,254,365	11,628,170	15,528,207	29,154,623	21,572,552
දළ ලාභය	**19,120,208**	**25,045,689**	**28,733,826**	**33,799,349**	**38,206,692**
දළ ලාභ අනුපාතය	**65%**	**68%**	**65%**	**54%**	**64%**



රූප සටහන 1 වාර්ෂික ලාභය

ධාරිතා සංවර්ධනයේ වැදගත්කම

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, නවෝත්පාදන නිෂ්පාදන, ක්‍රියාවලීන්, ව්‍යුහයන්, සංකීර්ණතා හා වෙනත් වූ ගෝලීයකරණය හා බැඳුණු අවදානම් සහිතව අද වන විට රටේ ආර්ථික සංවර්ධනය හා ස්ථායිතාවය සම්බන්ධව සේවා අංශයේ භූමිකාව ඉතා වැදගත් වේ. මෑත කාලීන වසර තුළ දියුණු ආර්ථිකයන් පවතින රටවල් තම සේවා සැපයුම් යාවත් කිරීමට උත්සහ දරන කල්හි, සංවර්ධනය වෙමින් පවතින රටවල් විවිධ ආකාරයෙන් තම ඒක පුද්ගල ආදායම හා ආර්ථික වර්ධනය වැඩි කරගැනීමට උත්සහ දරයි. විශේෂයෙන් ලෝක ආර්ථික වර්ධනයේ එන්ජිම ලෙස ආසියාවේ නැගී සිටීම තුළින් ව්‍යාපාරික පරිසරය තුළ, විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල සේවා අංශය තුළ වැඩි අවස්ථා ප්‍රමාණයක් නිර්මාණය කෙරෙයි.

මෙම පසුබිම තුළ දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ මූලික වගකීම වන්නේ එහි පුහුණු කටයුතු ලෝක මට්ටමට ගෙන ඒමත් අවශ්‍යතාවය පවතින අංශයන්ට දැනුම හා හැකියාව ලබාදීමේ නව මාර්ගයන් සොයා ගැනීමත් ය. ඒ අනුව, තරුණ විධායක සංවර්ධන වැඩසටහන්, වීඩියෝ සම්මන්ත්‍රණ හා ව්‍යාපෘති කළමනාකරණ වැඩසටහන් තුළින් අපට සාර්ථකව පුද්ගල සංවර්ධනය හා සංවිධානමය වෙනස්කම් ඇති කිරීමට හැකි වී ඇත. දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයට විවිධ සංස්කෘතීන් හා භාෂාවන් සහිත ලොව විවිධ සංවිධාන සමග සම්බන්ධතා ඇති හෙයින් ඵලදායී ලෙස දැනුම හා අත්දැකීම් බෙදා ගැනීමට හැකි වී ඇත.

දැක්ම

නවතම තාක්ෂණය භාවිතා කරමින් නිපුණතා සංවර්ධනයේ ලා උසස්ම තත්ත්වයේ මධ්‍යස්ථානය බවට පත්වීම.

මෙහෙවර

උසස් මට්ටමේ දැනුම් මධ්‍යස්ථාන හරහා ගෝලීය දැනුම් බෙදාගැනීමේ සේවාවන් ලබාදීම, තාක්ෂණය මත පදනම් වූ විශ්වසනීය පහසුකම් සැපයීම හා කැපවුණු විශේෂඥයන් පිරිසක් සමග ඉල්ලුම මත සැකසෙන ධාරිතා සංවර්ධන වැඩසටහන් සිදු කිරීම.

අපගේ වටිනාකම්

- නවෝත්පාදනීය හා නිර්මාණශීලී බව
- පාරිභෝගික අවශ්‍යතා කෙරෙහි ප්‍රතිචාරත්මක වීම
- බලවත් අවශ්‍යතාවය මත පදනම් වීම
- වගවීම හා කැපවීම
- නිපුණතා සංවර්ධනය පිළිබඳව විශ්වාසය

සංස්ථානික තොරතුරු

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලද්දේ සමාගම් පනත යටතේ 2001 නොවැම්බර් 01 වනදා වන අතර 2002 මාර්තු 26 වනදා එහි මෙහෙයුම් කටයුතු ආරම්භ විය.

මෙහි ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 10 ක් වන සාමාන්‍ය කොටස් 14,206,509 කින් සමන්විත වන අතර ඉන් 100% (14,206,509) ක්ම ශ්‍රී ලංකා රජයට හිමි වේ. මෙය රජයේ අයවැය හෝ සහනාධාර මත යැපීමෙන් තොරවූද ස්වයං අරමුදල් යොදවනු ලබන්නා වූද ව්‍යවසායකත්වයක් වේ.

එමෙන්ම එය, අන්තර්ක්‍රියාකාරී, බහු නාලිකා ජාල සහ නම්‍යශීලී ඉගෙනුම් ක්‍රමයක් වන බහු පාර්ශ්ව වීඩියෝ සම්මන්ත්‍රණ, අන්තර්ජාලය සහ වෙනත් උසස් සන්නිවේදන තාක්ෂණයන් යොදාගෙන පිරිවැය ඵලදායී ඉගෙනුම් අවස්ථා හා ධාරිතා සංවර්ධන වැඩසටහන් සපයන ලෝක බැංකු ආයතනයේ ගෝලීය සංවර්ධන ඉගෙනුම් ජාලයේ කොටසක්ද වේ.

එයට වෙනත් ජාත්‍යන්තර පුහුණු ආයතන සමගද සබඳතා ඇති අතර ශ්‍රී ලංකාව තුළ ඒවායේ පාඨමාලා පැවැත්වීමට වරප්‍රසාද ලද්දේද වෙයි.

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය CIMA සහ ACCA මාර්ගගත විභාග සඳහා පරීක්ෂණ මධ්‍යස්ථානයක් වන අතර කොළඹදී එවැනි විශාල සුරක්ෂිත පහසුකම් ලබාගත හැකි එකම ස්ථානය එය වේ. දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය 2017 වසරේදී දකුණු ආසියාවේ විශාලතම CIMA පරීක්ෂණ මධ්‍යස්ථානය බවට පත් වූ අතර සෑම වසරකම විභාග අපේක්ෂකයන් 2000 කට අධික පිරිසකට විභාගයට පෙනී සිටීමට අවස්ථාව සපයනු ලබයි.

මූලික කටයුතු

ගෝලීය දැනුම් බෙදාහැරීම, ඊ -ඉගෙනුම්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ පුහුණු කිරීම්, අධ්‍යාපන අංශයේ පුහුණු කිරීම් සහ රාජ්‍ය සහ පුද්ගලික අංශයේ සේවාදායකයන්ට ව්‍යාපාරික හමු හා වීඩියෝ සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා ඉහළම මට්ටමේ පහසුකම් සැපයීම. ප්‍රධාන පෙළේ ජාත්‍යන්තර විභාග පවත්වන ආයතන සඳහා සුරක්ෂිතව මාර්ගගත විභාග පැවැත්වීමේ පහසුකමද දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් සපයනු ලැබේ.

ලියාපදිංචි කාර්යාලය

28/10, මලලසේකර මාවත, කොළඹ 07

විගණකවරු

විගණකාධිපති, ශ්‍රී ලංකාව

ලේකම්වරු

Accounting Systems Secretarial Services (Private) Limited.

බැංකුකරු

ලංකා බැංකුව

අධ්‍යක්ෂ මණ්ඩලය



සභාපති

වසන්තා පෙරේරා මෙය
MSc in Project Management (Australia)
PgD in Economic Development (U/Col.)
PgD in Management (PIM, U/SJP)
BSc. (U/Pera)
ලේකම් –සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය



ආචාර්ය එස් එච් ඒ එම් අබේරත්න
PhD IUA, M A in Economics, Dip Development Economics, University of Manchester UK
B A Economics, B Phl Economics (Uni Colombo)



ෆයිසාල් සාලී මහතා
B A Economics (First Class Honors), MBA (Sri J)
ලංකා වාණිජ මණ්ඩලයේ ප්‍රධාන කමිටු සාමාජික;
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, කාගිල්ස් බැංකුව; අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, HNB General Insurance Limited; උප සභාපති, ශ්‍රී ලංකා අධ්‍යක්ෂකවරුන්ගේ ආයතනය
.



ටානියා අලිකී පෙරේරා මෙය
ACMA (UK), MBA (Sri J)
නියෝජ්‍ය මහ ලේකම්/මූල්‍ය පාලක
ලංකා වාණිජ මණ්ඩලය



කල්‍යාණි ගුණතිලක මෙය
MBA in HR Management (Sri J), MSc in Economics (Uni. Illinois, USA),
BA Special Sociology (Sri J)
PG Dip. in Economic Development (Uni of Colombo),
Prof. Dip. in HR Systems and Techniques (Sri J)
සහකාර අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව

මණ්ඩලය සඳහා භාණ්ඩාගාර නියෝජිත



කේ ඒ රම්‍යා කාන්ති මෙය
MA in Policy Economics (USA)
MA in Financial Economics (UoC)
PgD in Economic Development (UoC)
Bsc (Sp. Deg.) (UoC)
අධ්‍යක්ෂ, කොම්ප්ට්‍රෝලර් ජෙනරල් කාර්යාලය
මුදල් අමාත්‍යාංශය

අලිකී පෙරේරා මෙය ට විකල්ප අධ්‍යක්ෂ



ආචාර්ය සෙල්වනාදන් අනෝජන්
Ph.D., M.Phil., MBA, BBA, B.Eng
සහකාර මහ ලේකම්
ලංකා වාණිජ මණ්ඩලය

මානව සම්පත්

කළමනාකරණ කණ්ඩායම



ප්‍රධාන විධායක නිලධාරී
ගර්ෂෝන් අරුලානන්දම්
ACIM (UK), FIM (SL), MBA (Peradeniya)



ඉගෙනුම් සංවර්ධන හා අලෙවිකරණ කළමනාකරු
කීර්ති විජේසේකර
MCIM (UK), AABE (UK) MBA UniSunderland UK,
MSc HRM & Dev. University of Salford UK



තොරතුරු තාක්ෂණ කළමනාකරු
අරුණ බුද්ධික
MSc SITM (UK), ACS



මූල්‍ය හා පරිපාලන කළමනාකරු
ලක්ෂිකා කළුබෝවිල
BBA (Sp) 2nd Upper (Hons.),
MBA (Colombo), CBA , MAAT



සහකාර අලෙවි කළමනාකරු
වජිර අබේනායක
Advance Diploma in Business Management (NIBM)

අපගේ කණ්ඩායමේ අනෙක් සාමාජිකයන්



වමේ සිට

සුලේක දිසානායක (පරිපාලන සහකාර), නිරෝෂා ප්‍රියදර්ශනී (වැඩසටහන් සමායෝජක),
ලක්මාලි සමරසේකර (විධායක ලේකම්), ධනුෂ්කා දුෂන්ති (ලේඛක සහකාර),
නයනි කල්පගේ (ගිණුම් සහකාර), රොමේෂ් පෙරේරා (තොරතුරු තාක්ෂණ සහකාර)

භෞතික සම්පත්

නවීනතම තත්ත්වයේ වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම

පුද්ගලික මයික්‍රෆෝන සහිත සක්‍රිය සහභාගිවන්නන් 30 ක් හා අනෙකුත් නිරීක්ෂකයන් 50 කට පහසුකම් සැපයිය හැකිය.
















පරිගණක සහිත බහු මාධ්‍ය කාමර ද්වය

එකක් පරිගණක 30 කින්ද අනෙක පරිගණක 50 කින්ද සමන්විතය

Pearson VUE Testing Center

(ආසන 90 කින් සමන්විතය)





අවශ්‍ය විට දේශන කාමරයක් ලෙස භාවිතා කළ හැකි ඉඩකඩ සහිත ලොබිය

සියලුම සම්මන්ත්‍රණ කාමර සඳහා ඕඩියෝ සංවාද පහසුකම් ඇත

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම ඔස්සේ පහත සේවාවන් සපයනු ලබයි

- සංකලිත ඉගෙනුම් ක්‍රම භාවිතයට ගනිමින් ක්ෂුද්‍ර මූල්‍ය, ස්වභාවික සම්පත් කළමනාකරණය හා විද්‍යාව සහ දේශගුණ විපර්යාස පිළිබඳ ප්‍රතිපත්තිය යනාදී තේමා ඔස්සේ පවත්වනු ලබන සහතික පත්‍ර පාඨමාලා
- විපත් අවස්ථාවන්හිදී හෙද සත්කාර සහ Partograph යනාදී විෂයයන් සම්බන්ධයෙන් ලොව පුරා පවතින විවිධ සම්පත් මධ්‍යස්ථාන මගින් සපයනු ලබන පුහුණු වැඩසටහන් සමග වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම ඔස්සේ සම්බන්ධ වීම
- ලොව වෙනත් ප්‍රදේශවල වෙසෙන කීර්තිමත් කථිකයින් (ඒ ඒ විෂයයන්හි ප්‍රවීණයින්) විසින් පවත්වනු ලබන කෙටි සම්මන්ත්‍රණ සහ ඉදිරිපත්කිරීම්
- කොරියානු සංවර්ධන අත්දැකීම් වැනි තේමා ඔස්සේ විවිධ රටවල් සම්බන්ධ කරමින් පවත්වනු ලබන ගෝලීය අත්දැකීම් හුවමාරු කරගැනීමේ සංවාද
- වෙබ් යෙදුම් ආරක්ෂණය (Web Application Security) වැනි පාරිභෝගික අවශ්‍යතාවන් සැපිරීම සඳහා ඒ ඒ පුද්ගලයින් හෝ කාර්යයන් සඳහා සැකසූ පුහුණු වැඩසටහන්
- වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම ඔස්සේ ව්‍යාපාරික සම්මන්ත්‍රණ හා හමු, ශාස්ත්‍රීය සංවාද සහ දේශ සීමා අතර පවුලේ උත්සව යනාදිය පැවැත්වීම සඳහා පහසුකම් කුලියට සැපයීම

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් එහි පහසුකම් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ සේවාවන් ශ්‍රව්‍ය සම්මන්ත්‍රණ මෙන්ම මුහුණට මුහුණලා පැවැත්වෙන පැවැත්වෙන කටයුතු සහ විභාග (පරිගනක පාදක කොටගත් සහ අනෙකුත් විභාග) සඳහා කුලියට සපයනු ලැබේ

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් එහි බහු මාධ්‍ය පහසුකම ඔස්සේ පහත සේවාවන් සපයනු ලබයි

- සංවර්ධනය වෙමින් සිටින තරුණ විධායකයින් ගෝලීය ප්‍රවණතාවන්ට නිරාවරණය කරන්නා වූ වැඩසටහන්
- බඳවාගැනීම් සහ උසස්වීම් සඳහා පරිගනක පාදක කරගත් විභාග
- ඊ -ඉගෙනුම් භාවිතා කරමින් ඒ ඒ පුද්ගලයින් හෝ කාර්යයන් සඳහා සැකසූ විදේශීය හා දේශීය පුහුණු වැඩසටහන්
- පරිගනක පුහුණුව (පරිගනක පිළිබඳ අත්‍යවශ්‍ය දැනුම (Computer Essentials) , ජාත්‍යන්තර පරිගනක ධාවන බලපත්‍රය, ශ්‍රී ලංකා පරිගනක ධාවන බලපත්‍රය, උසස් ඊ -කාර්යාල නිපුණතා යනාදිය)
- ව්‍යාපෘති කළමනාකරණය, ඉදිරිපත් කිරීමේ කුසලතා, ප්‍රකාශන කුසලතා, ඊ ඉගෙනුම් අන්තර්ගතය සංවර්ධන කුසලතා යනාදිය පිළිබඳ පරිගනක පාදක කරගත් පුහුණු
- ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු,මෘදුකාංග ප්‍රවර්ධන කටයුතු සහ පරිගනක පාදක කොටගත් පුහුණු සහ පරිගනක/ අන්තර්ජාලය පාදක කොටගත් විභාග සඳහා අවශ්‍ය පහසුකම් කුලියට සැපයීම

වැඩිදුර තොරතුරු සඳහා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ වෙබ් අඩවියට පිවිසෙන්න

www.dlcsrilanka.org

මෙයට අමතරව දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් පහත සේවාවන්ද සපයනු ලැබේ

- ඊ -ඉගෙනුම් මූලාරම්භයන් සඳහා අවශ්‍ය අන්තර්ගතයන් සකස් කිරීම, පරිවර්තනය සහ ඒවා සංයුක්ත තැටි ලෙස සැකසීම
- කාර්යයන් ලේඛනගත කිරීම (ඩිජිටල් සහ මුද්‍රිත)
- සේවාලාභීන්ගේ අවශ්‍යතා සැපිරීම සඳහා සුදුසු අපේක්ෂකයින් බඳවාගැනීම සඳහා විභාග සැලසුම් කිරීම

2018 වසරේ පවත්වන ලද ප්‍රධාන පුහුණු වැඩසටහන් ගැලරිය

1. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන්

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු තුනක (වයඹ, බස්නාහිර සහ මධ්‍යම පළාත්) විදුහල්පතිවරු සහ අධ්‍යාපන පරිපාලකවරු 1200කට අධික පිරිසක් සඳහා පුහුණු වැඩසටහන් 30කට අධික ප්‍රමාණයක් පවත්වන ලදී. මෙම පුහුණු වැඩසටහන නිර්මාණය කර තිබුණේ ජාතික විභාගවලදී ශිෂ්‍යයින්ගේ ප්‍රතිඵල ඉහළ නංවාගැනීම සඳහා පළාත්වලට සහාය වීම සඳහාය.

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් අධ්‍යාපන අංශය සඳහා නව වැඩසටහන් දෙකක් හඳුන්වාදෙන ලදී. එනම්; පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවලට අනුයුක්තව සේවය කරන සේවාස්ථ උපදේශකයින් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ /සංවර්ධනය කිරීමේ වැඩසටහන සහ සැලසුම්කරණ අධ්‍යක්ෂවරුන් සඳහා (අධ්‍යාපන සැලසුම්කරණ) අධ්‍යාපන සැලසුම්කරණය.





2. මාර්ගගත විභාග

2018 වසරේදී ද දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා බ්‍රිටිෂ් කවුන්සිලය එක්ව එහි කේම්බ්‍රිජ් ඉංග්‍රීසි විභාග, සමාගමේ පහසුකම් භාවිතා කොට පැවැත්වීමට කටයුතු කරන ලදී. විවිධ සේවාදායකයින් සඳහා මාර්ගගත විභාග පැවැත්වීම අතින් දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය ප්‍රමුඛස්ථානයේ සිටී. CIMA, ACCA, CASTLE, GATE, JEE, PSI සහ AWS යනාදිය ආයතනය විසින් මෙම සේවාව ලබාදෙන සේවාදායකයින් සමහරකි.සුරක්ෂිත විභාග පරිසරයක් සහිත මෙම ආයතනය පරිගනක විභාග සඳහා සුරක්ෂිත විභාග මධ්‍යස්ථාන අවශ්‍ය වන සේවාදායකයින් මෙන්ම ඔවුන්ගේම ආයතන තුළ ප්‍රශ්න පත්‍ර පාදක කොටගත් විභාග පැවැත්වීමට අවශ්‍ය වන සේවාදායකයින් අතර ප්‍රචලිත ආයතනයකි.





3. මහජන වැඩමුළු මාලාවන්

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් වැඩි ඉල්ලුමක් සහිත මාතෘකා යටතේ පවත්වන, එහි මහජන වැඩමුළු පවත්වන වාර ගණන ඉහළ දමනු ලැබීය. දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය 2018 වසරේදී ප්‍රසම්පාදන කළමනාකරණය, කාර්ය මණ්ඩල විනය ක්‍රියාපටිපාටීන්, තොරතුරු තාක්ෂණ ප්‍රසම්පාදන කළමනාකරණය, මූල්‍ය රෙගුලාසි, තොරතුරු පද්ධති විගණනය,ප්‍රසම්පාදන විගණනය, පද්ධති හා ජාල පරිපාලනය සහ Advanced Excel යනාදී මාතෘකා ඔස්සේ වැඩමුළු පැවැත්වීය.





4. KDI පාසල සමග සහයෝගීතාව

කලාපීය සංවර්ධනය පිළිබඳ මිශ්‍ර ඉගෙනුම් වැඩසටහන



කොරියාවේ KDI පාසල හරහා කලාපීය සංවර්ධනය පිළිබඳ මිශ්‍ර ඉගෙනුම් වැඩසටහනක් සාර්ථක අන්දමින් පැවැත්වීමට දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් කටයුතු කරන ලදී. මෙම වැඩසටහන වීඩියෝ සම්මන්ත්‍රණ 7 කින් සහ මුහුණට මුහුණලා සියොල්හිදී පවත්වන ලද පුහුණුවකින් සමන්විත විය. එම වීඩියෝ සම්මන්ත්‍රණ 7 සාර්ථක අන්දමින් සම්පූර්ණ කළ, එයට ශ්‍රී ලංකාවෙන් සහභාගී වුණු පුද්ගලයා කොරියාවේ පැවැත්වුණු පුහුණුව සඳහා පූර්ණ අනුග්‍රහය ලබා සහභාගී විය.



5. ආසියානු ඵලදායිතා සංවිධානය සමග හවුල්කාරීත්වය

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය ආසියානු ඵලදායිතා සංවිධානය සහ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය සමග එක්ව මාතෘකා තුනක් යටතේ වීඩියෝ සම්මන්ත්‍රණ වැඩමුළු තුනක් පැවැත්වීම සඳහා පහසුකම් සලසන ලදී. එම මාතෘකා නම්;

i. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා කළමනාකරණ නව්‍යකරණය පිළිබඳ ඊ - ඉගෙනුම් පාඨමාලාව
ii. කෘෂි ව්‍යාපාර තුළ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ඊ - ඉගෙනුම් පාඨමාලාව
iii. සෞඛ්‍ය අංශය සඳහා සේවාලාභී තෘප්තිය පිළිබඳ ඊ - ඉගෙනුම් පාඨමාලාව

මෙම වැඩසටහන් දින හතරක් පුරා පැවැත්වුණු අතර එයට ක්ෂේත්‍ර චාරිකාවක්ද පිරිස වෙනුවෙන් රට පිළිබඳ ඉදිරිපත් කිරීමක්ද එයට ඇතුළත් විය. මෙම වැඩසටහන් සඳහා වීඩියෝ සම්මන්ත්‍රණ ක්‍රමය ඔස්සේ රටවල් 10 කට අධික ප්‍රමාණයක් සහභාගී විය.



පසුගිය වසර 5 පුරා මූල්‍ය වර්ධනය

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂයේ ප්‍රතිඵල සාරාංශය	2018 රු. මි.	2017 (යළි ප්‍රකාශිත) රු. මි.	2016 රු. මි.	2015 රු. මි.	2014 රු. මි.
පිරිවැටුම	59.8	62.9	44.3	36.6	29.4
වෙනත් ආදායම්	7.8	6.5	4.1	3.5	4.6
මුළු ආදායම	67.6	69.6	48.4	40.1	34.0
මුළු වියදම්	52.5	55.5	40.6	33.6	30.7
බදුවලට පෙරවසරේ ශුද්ධ ලාභය	15.1	14.1	7.8	6.5	3.3
කාර්ය මණ්ඩල පිරිවැය	13.0	11.7	10.5	10.3	9.3
කාර්ය මණ්ඩල සාමාජිකයන් ගණන	12	11	10	9	9

දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්වය	2018 රු. මි.	2017 (යළි ප්‍රකාශිත) රු. මි.	2016 රු. මි.	2015 රු. මි.	2014 රු. මි.
ප්‍රකාශිත ප්‍රාග්ධනය	142.06	142.06	142.06	142.06	142.06
ගිවිසුම යටතේ රජය විසින් නැවත ගෙවිය යුතු ජංගම නොවන වගකීම්	3.2	6.4	9.6	12.8	16.0
ජංගම වගකීම්	6.9	5.5	1.7	2.6	2.0
මුළු සමකොටස්/වගකීම්	130.3	115.7	100 7	97.1	93.7
කෙටි කාලීන ආයෝජන	84.0	68.8	53.6	49.7	48.6
කාරක ප්‍රාග්ධනය	88.1	73.1	60.9	57.8	55.6
මුළු වත්කම්	130.3	115.7	100.7	97.1	93.7

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය ලිමිටඩ් -PB 192

2018 දෙසැම්බර් 31 වනදායින් අවසන් වූ වසර සඳහා සමාගමේ කටයුතු සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

2018 දෙසැම්බර් 31 වනදායින් අවසන් වුණු වසර සඳහා වන විගණනය කළ ගිණුම් ප්‍රකාශය සමග අධ්‍යක්ෂ මණ්ඩලය තම වාර්තාව ඉදිරිපත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි.

1. ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ව්‍යාපාර කාර්යයන් වන්නේ ගෝලීය දුරස්ථ ඉගෙනුම් ජාලය භාවිතා කරමින්, විශේෂයෙන් රාජ්‍ය කළමනාකරණය සහ ආර්ථික සංවර්ධනය යන ක්ෂේත්‍රයන් තුළ ජාත්‍යන්තර විද්වතුන් සමග සම්බන්ධතා පැවැත්වීමේ අවස්ථාවන් ලබාදීමට සහ තොරාතුරු යාවත් කිරීමට රාජ්‍ය සහ පුද්ගලික අංශයේ සේවකයන් සඳහා වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු, සමුළු සහ අනෙක් කාර්යයන් සංවිධානය කිරීම සහ පැවැත්වීමයි.

2. අධ්‍යක්ෂවරුන්

2018 දෙසැම්බර් 31 වන විට සමාගම් අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කළේ පහත සඳහන් පුද්ගලයන් ය.

වසන්තා පෙරේරා මෙය - සභාපතිනිය
ආචාර්ය එස්.ඒ.එම්. අබේරත්න - අධ්‍යක්ෂ
එම්.ඕ. ෆයිසාල් සාලී මහතා - අධ්‍යක්ෂ
කේ. ගුණතිලක මෙය - අධ්‍යක්ෂ
කේ. ඒ. රම්‍යා කාන්ති මෙය - අධ්‍යක්ෂ
අලිකී ඉස්මයිල් මෙය - අධ්‍යක්ෂ

ආචාර්ය අනෝජන් සෙල්වනාදන් - අලීකී ඉස්මයිල් හට විකල්ප අධ්‍යක්ෂ
(2018.06.26 දින පත් කරන ලදී)

සමාගමේ ව්‍යවස්ථාවේ 89 හා 90 වගන්තිය අනුව මාරුවෙන් මාරුවට විශ්‍රාම ගන්නා වසන්තා පෙරේරා මෙය සහ එම්.ඕ. ෆයිසාල් සාලී මහතා පැමිණෙන වාර්ෂික මහ සභා වාරයේදී නැවත පත්වීම සඳහා ඉදිරිපත් වෙනු ඇත.

2007 අංක 07 දරන සමාගම් පනතේ 210 හා 211 වගන්තිවලට අනුව විශ්‍රාම ලබන ආචාර්ය එස්.ඒ.එම් අබේරත්න මහතා පැමිණෙන වාර්ෂික මහ සභා වාරයේදී නැවත පත්වීම සඳහා ඉදිරිපත් වෙනු ඇත.

3. මූල්‍ය ප්‍රකාශය

සමාගමේ මූල්‍ය ප්‍රකාශය වාර්ෂික වාර්තාව තුළ දක්වා ඇත.

4. විගණක වාර්තාව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණක වාර්තාව, වාර්ෂික වාර්තාව තුළ දක්වා ඇත.

5. ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම්වලට සටහන්

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් වාර්ෂික වාර්තාව තුළ දක්වා ඇති අතර භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්ති තුළ කිසිදු ද්‍රව්‍යාත්මක වෙනසක් සිදු වී නැත.

6. සම්බන්ධතා පිළිබඳ ලේඛනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 192 වන වාගන්තිය අනුව සමාගම සම්බන්ධතා ලේඛනයක් පවත්වා ගෙන යනු ලබයි.

7. අධ්‍යක්ෂවරුන්ගේ ගිවිසුම් සම්බන්ධතා

වසන්තා පෙරේර මෙය, එම්.ඕ ෆයිසාල් සාලී මහතා, ආචාර්ය එස්.ඒ.එම්. අබේරත්න, කේ. ගුණතිලක මෙය අලිකී ඉස්මයිල් මෙය කේ.ඒ.රම්‍යා කාන්ති මෙය අධ්‍යක්ෂවරුන්, මූල්‍ය ප්‍රකාශයට වන 22 වන සටහන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුළ සමාගමේ ගිවිසුම්වලට සම්බන්ධතා දක්වා නොමැත.

8. අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික සහ වෙනත් ප්‍රතිලාභ

සමාගමට අදාළව 2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මූල්‍ය වසර සඳහා අධ්‍යක්ෂවරුන්ට පාරිශ්‍රමික ගෙවූයේ නැත

9. ශේෂ පත්‍ර දිනයට පසුව සිදු වූ සිදුවීම්

වාර්තාකරණ දිනය අතර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදුකිරීමට හෝ හෙළිදරව් කිරීමට අවශ්‍ය ද්‍රව්‍යමය සිදුවීම් සිදුව නොමැත.

10. බදුකරණය

ආදායම් ප්‍රකාශයට අනුව, 2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා වන බදු ඉතුරුම රු. 247,956/-. කි.

11. ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන් තම දැනුමේ ප්‍රකාරව, රජයට ගෙවීමට නියමිත සියලුම ගෙවීම්, ලද හැකි මූල්‍ය හැකියාවන් මත ගෙවා ඇති බවට සෑහීමකට පත්වේ.

12. ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම්

ශේෂ පත්‍ර දිනයට සැලකිය යුතු ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාවය බැරකම් නොතිබිණි.

13. විගණකවරු

සමාගමේ වර්තමාන විගණකවරුන් වන්නේ ජාතික විගණන කාර්යාලය වන අතර පැමිණෙන වාර්ෂික මහ සභා රැස්වීමේදීද සමාගම් විගණකවරු ලෙස පත් වෙනු ඇත.

14. වාර්ෂික මහා සභා රැස්වීම

සමාගමේ වාර්ෂික මහසභා රැස්වීම 2018 මැයි 30 වන දින අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07 හිදී 2018 මැයි 30 දින ප.ව. 4.00 ට පැවැත්වෙනු ඇත.

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි
අකවුන්ටින්ග් සිස්ටම්ස් සෙක්‍රටේරියල් සර්විසස් පුද්ගලික සමාගම

....

සභාපතිනිය **අධ්‍යක්ෂවරු**

.....

ලේකම්වරු

දිනය: 2019 මැයි 15

විගණකවරුන්ගේ වාර්තාව

විගණන කමිටු වාර්තාව 2018

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ විගණන කමිටුවේ සභාපතීත්වය උසුලන්නේ භාණ්ඩාගාර නියෝජිත කේ.ඒ.රම්‍යා කාන්ති මෙය වන අතර, එහි ආචාර්ය එස්.එච්.ඒ.එම්. අබේරත්න සහ කේ. ගුණතිලක මෙය විධායක නොවන මණ්ඩල සාමාජිකත්වය උසුලයි. 2018 වසරේ දී කමිටුව පස් වරක් රැස්වූ අතර එයට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කළ චක්‍රලේඛ සමග දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය අනුකූල වන්නේ ද යන්න සාකච්ඡා කිරීමට සහ දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය නව සහ යාවත්කාලීන කළ චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කිරීම තහවුරු කිරීමට ඒවායේ වෙනස්කම් පිළිබඳව යාවත් කිරීම් කරන නිලධාරියෙකු පත් කිරීමට උපදෙස් ලබා දුන් විශේෂ රැස්වීමක් ද ඇතුළත් වේ.

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය 2017 අවසානය වන තෙක් අභ්‍යන්තර විගණන කටයුතු භාර දී තිබුණේ බී.ආර්. ද සිල්වා සහ සමාගමට යි. කෙසේ වෙතත් අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශය විසින් පත් කළ අභ්‍යන්තර විගණකවරයෙකු විසින් කළ යුතු බවට විගණන කමිටුවේ තීරණය කළ අතර දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ එකඟතාව ඵල කරන ලදී. ඒ අනුව දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ ඉල්ලීම අනුව එහි රේඛීය අමාත්‍යාංශය වන රාජ්‍ය පරිපාලන සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර විගණකගේ කටයුතු ආවරණය කිරීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අභ්‍යන්තර විගණකවරයා පත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

2018 වසර තුළ විගණන කමිටුව විසින් පහත ප්‍රධාන කටයුතු සිදු කරන ලදී.

1. ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූලතාව ඇතුළත්ව වාර්ෂික විගණන සැලසුමක් සැකසීම.
2. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග ඇති රඳවාගැනීමේ බදු ප්‍රතිදාන ගැටළුව නිවැරදි කිරීම කඩිනම් කිරීම.
3. දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ බඳවා ගැනීමේ පටිපාටිය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

අභ්‍යන්තර විගණන ක්‍රියාකාරීත්වය ශක්තිමත් කරන අතර දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ යහපාලනය පිළිබඳ අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා කටයුතු කර ඇත.

රම්‍යා කාන්ති (මෙය)
සභාපතිනිය
දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ විගණන කමිටුව

බාහිර විගණකවරයාගේ වාර්තාව

සභාපති
සීමාසහිත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය

සීමාසහිත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය 2018 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශ සහ අනෙකුත් නීති රෙගුලාසි සම්බන්ධව 2018, අංක 19 දරන මුදල් පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

1. මූල්‍ය තත්ත්ව ප්‍රකාශන

1.1 තත්වගණනය කල මතය

සීමාසහිත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය ආයතනයේ 2018 දෙසැම්බර් 31 වන දිනට සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු සාරාංශයකින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශය, 2018 අංක 19 දරන ජාතික විගණන පනත සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධාන යටතේ විගණනය කරන ලදී. මාගේ වාර්තාව ව්‍යවස්ථාවේ අංක 154(6) අංශයන්හි නියාමන විධිවිධාන අනුගමනය කරමින් නියමිත දිනවකවානු වලදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ඇත.
මාගේ මතය අනුව මෙම වාර්තාවේ අඩංගු තත්වගණනය කල මතයන්හි ඉදිරිපත් කර ඇති යම් සුවිශේෂී කරුණු සහ එහි බලපෑම් හැරුණු විට අනෙකුත් මුල්‍ය ප්‍රකාශන 2018 දෙසැම්බර් 31 දින වන විට මෙම සමාගමේ මුල්‍ය ස්ථාවරත්වය සහ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මුල්‍ය කාර්ය සාධනය සහ මුදල් සංසරණය පිලිබඳව කුඩා සහ මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දේ.

1.2 තත්වාගණනය කල මතය සඳහා වූ පදනම

ඇ) කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් පිලිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි 11.21 කොටස හරහා අවධාරණය කර ඇති, 2018 දෙසැම්බර් මස දක්වා වසර 5ක් තුල ලැබිය යුතු නමුත් නොගෙවූ රැඳවුම් බද්ධ රුපියල් 3,477,438 මුදල්, තව දුරටත් ලබාගත හැකි බදු මුදලක් ලෙස හානිකර නීතිමය විධිවිධාන ක්‍රියාත්මක කිරීමකින් තොරව දක්වා ඇත.

ආ) කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් පිලිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි 29 කොටස හරහා අවධාරණය කර ඇති පරිදි ගෙවීම කල් දමන ලද බදු ගෙවිය යුතු ආදායම් හා සම්බන්ද බදු අනුපාතිකයන් කල් දමන ලද බදු වගකීම් අදාළ ගෙවීම් සිදුකරන වකවානුවට අනුරූප දල බදු අනුපාතිකයන් හා බදු ගෙවිය යුතු ආදායම් භාවිත කරමින් තක්සේරු කෙරෙනු ඇත. නමුත් ඊට ප්‍රතිවිරුද්ධව පොලී ආදායම් සඳහා වන කල් දමන ලද බදු සහ බදු වගකීම් සඳහා 28% ක බදු ප්‍රතිශතයක් වෙළඳ ආදායම් සඳහා වන බදු අහිමිවීමකදී සහ බදු ගෙවීමේ අනුපාතය 14%ක් වන අවස්ථා දෙකේදී යොදා ගැනෙනු ඇත. එහි ප්‍රතපලයක් වශයෙන් මේ වර්ෂයේ ආදායම් බදු වියදම සහ කල් දමන ලද බදු වත්කම රුපියල් 3,374,000 කින් ඉහල ගොස් ඇත.

මාගේ විගණන වාර්තාව ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට අනුකූලව සිදු කර ඇත. එම ප්‍රමිතීන් හා සම්බන්ද මා සතු වගකීම් මෙම වාර්තාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන කොටසේ විගණනකගේ වගකීම් යටතේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්වගණනය කල මතයෙහි පදනම සඳහා අවශ්‍ය තරම් නිවැරදි තොරතුරු සහ විගණන සාක්ෂි මම විසින් ලබාගෙන ඇති බව විශ්වාස කරමි.

1.3 කළමනාකාරීත්වයේ සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන හා සම්බන්ධපාලනාධිකාරී බලතල ඇති අය පිළිබඳ වගකීම්

කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ දැක්මක් සහිත මූල්‍ය තත්ත්ව සම්පාදනය කිරීම සම්බන්දව කළමනාකාරිත්වය වග වියයුතු අතර එවැනි මූල්‍ය තත්ත්ව සම්පාදනය කිරීමේදී ඒවා ප්‍රමාණාත්මක සාවධ්‍ය ප්‍රකාශයන්ගෙන්තොර වියයුතු බවට කළමනාකාරිත්වය නිවරදිව තහවුරු කරගත යුතුය.
මූල්‍ය තත්ත්ව සම්පාදනය කිරීමේදී, කළමනාකාරිත්වය විසින් ව්‍යාපාරය ඈවර කිරීමට හෝ සම්පුර්ණයෙන් අත්හිටුවීමට හෝ වෙනත් යථාර්තවාදී විකල්පයක් නොමැති අවස්ථාවකදී හැර අදාල සමාගම සතු ලාභදායි ව්‍යාපාරයක් ලෙස ඉදිරියට පවත්වාගැනීමේ හැකියාව සහ අවශ්‍ය පරිදි කරුණු හෙළිදරවු කිරීම ඇතුළු ලාභදායි ව්‍යාපාරයක් සම්බන්ද තොරතුරු සහ එහි ගිණුම්කරණ පදනම තක්සේරු කිරීමට කළමනාකාරිත්වය වගවියයුතුය.
වගකීම් පැවරී ඇති අය සමාගමේ මූල්‍ය තොරතුරු සම්පාදනය කිරීම පිලිබඳ වගවිය යුතුය.
2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි 16 (1) කොටසට අනුරූපව ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් සම්බන්දව නිවැරදි පොත්පත් සහ වාර්තා පවත්වා ගැනීමට සහ ඒ හරහා වාර්ෂික සහ කලාවර්තිත මූල්‍ය තත්ත්ව වාර්තා සම්පාදනය කිරීමට අදාල සමගම සමත්විය යුතු යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන පිලිබඳ කළමනාකරණයේ වගකීම්

මාගේ විගණනය මත පදනම්ව, මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව ප්‍රමාණාත්මක සාවධ්‍ය ප්‍රකාශයන්ගෙන් තොර, වංචා හෝ වැරදි අන්තර්ගත නොවන සාධාරණ තහවුරුවක් ලබාදිය හැකි, එමෙන්ම මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ මතය ද සහිත විගණන වාර්තාවක් ලබාදීම අරමුණ වේ. සාධාරණ තහවුරුවක් ලබා දී තිබීම පමණක් වුවද යම් ඉහල මට්ටමක තක්සේරුවක් පිලිබඳ අදහසක් ඇති කලද ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට අනුකූලව සිදුකෙරෙන විගණනයන්හි දී වුව ද ප්‍රමාණාත්මක සාවධ්‍ය ප්‍රකාශයන් මගහැරීම සිදුවියහැක. සාවධ්‍ය ප්‍රකාශයන් වංචා හෝ වැරදීම් වල ප්‍රතිඵලයන් ලෙස ඇතිවිය හැකි අතර ඒවා ප්‍රමාණාත්මක වීමට තනි තනිව හෝ එකතුවක් වශයෙන් මූල්‍ය තත්ව ප්‍රකාශන මත ගනු ලබන වාණිජමය තීරණ සඳහා බලපෑම් කල යුතුය.
මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට අනුකූලව මෙම විගණනය සිදු කර ඇති අතර එම සමස්ත විගණන ක්‍රියාවලිය තුල අවශ්‍ය වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සන්දේහවාදය පවත්වා ගන්නා ලදී. එසේම:

- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයන්හි වංචා සහගත හෝ වැරදි ප්‍රමාණාත්මක සාවධ්‍ය ප්‍රකාශයන් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම, එම තත්වයන්ට සංවේදී විගණන ක්‍රියා පටිපාටීන් ගොඩනැගීම සහ ක්‍රියාත්මක කිරීම, එමෙන්ම මාගේ මතය සඳහා වන පදනම වෙනුවෙන් වූ විගණන සාක්ෂි එකතු කිරීම. වංචාව නිසා සිදුවන ප්‍රමාණාත්මක සාවධ්‍ය ප්‍රකාශයක් නිවැරදිව ග්‍රහණය කර නොගැනීම වැරදීමක් නිසා සිදුවන ප්‍රමාණාත්මක සාවධ්‍ය ප්‍රකාශයක් හරහා සිදුවන හානියට වඩා බරපතල වනුයේ ඒවා දුස්සන්ධාන, ව්‍යාජ අත්සන් යෙදීම, අභිප්‍රයික පැහැර හැරීම, ව්‍යාජ පෙනීසිටීම් හෝ අභ්‍යන්තර පාලනයන් නොසලකා කටයුතු කිරීම වැනි තත්වයන් සමඟ බැඳී ඇති හෙයිනි.

- සමාගමේ අභ්‍යන්තර පාලනයන් පිලිබඳ අවබෝධයක් ඇතිකර ගැනීම වැදගත් වනුයේ එම අභ්‍යන්තර පාලනයන්හි ඵලදායිතාව පිලිබඳ මතයන් ඉදිරිපත් කිරීමට නොව, එම සමාගම්වලට අනුරූපව විගණන ක්‍රියාපටිපාටීන් සම්පාදනය කරගැනීමටය.

- කළමනාකාරිත්වය විසින් භාවිත කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ ගිණුම්කරණ තක්සේරු වාර්තාවල සාධාරණත්වය සහ අනාවරණයන් ඇගයීමට ලක් කිරීම.

- සුදුසුතාවය මත කළමනාකරණය භාවිතාව තුලින්, ගිණුම්කරණය මත පදනම් වූ විගණන සාක්ෂි මත පිහිට අඛණ්ඩව ලාභ ලබන ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමට සමාගම සතු හැකියාව අභියෝගයට ලක්කෙරෙන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් පැවතීම නිශ්චය කරන්න. එවැනි

ප්‍රමාණාත්මක අවිනිශ්චිත තාවයක් ඇති බවට මා විසින් නිගමනය කරන ලද අවස්ථාවන් වලදී ඒ පිලිබඳ මාගේ විගණන වාර්තා තුලින් අදාළ මූල්‍ය තත්ව වාර්තා ප්‍රකාශනයන් සඳහා කරුණු ඉදිරිපත් කිරීමටත්, මාගේ මතය ප්‍රමාණවත් නොවන අවස්ථාවන් වලදී සංශෝදන ඉදිරිපත් කිරෙමටත් කටයුතු කෙරෙනු ඇත. මාගේ නිගමනයන් විගණන වාර්තා සම්පාදනය කරන ලද අවසාන දිනය දක්වා එකතු කරන ලද විගණන සාක්ෂි මත පදනම් වන අතර තවදුරත් සිදුවන ක්‍රියාකාරකම් සහ සිදුවීම් සමගම ලාභ ලබන ව්‍යාපාරයක් ලෙස ඉදිරියට පවත්වාගෙන යෑම අඩපන කිරීමට හේතු විය හැක.

- කරුණු අනාවරණය කිරීම ඇතුළු මුල්‍ය තත්ත්ව ප්‍රක්ෂනවල ව්‍යුහය, සමස්ථයක් වශයෙන් ගත විට කරුණු ඉදිරිපත් කිරීම සහ මූල්‍ය තත්ත්ව වාර්තා හරහා අදාල ගනුදෙනු හා ක්‍රියාකාරකම්වල සාධාරණ කරුණු ඉදිරිපත් කිරීමක් ඇති බව ඇගයීමට ලක් කර ඇත.

මුල්‍ය විගණන ක්‍රියාපටිපාටිය අතරතුර අභ්‍යන්තර පරිපාලන දුර්වලතා ඇතුළු අනෙකුත් විගණනය ආශ්‍රිත සොයාගැනීම් පිලිබඳ පාලනාධිකාරී බලතල සහිත අංශ සමඟ මනා අවබෝධයක් සහිතව කරුණු හුවමාරු කරගැනීමට කටයුතු කරන ලදී.

2. නෛතික සහ අනෙකුත් නියාමනයන් සම්බන්ධ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනත, 2007 අංක 07 දරන සමාගම් පනත පහත සඳහන් කරුණු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපයා ඇත.

- තත්වගණනය කල මතය සඳහා වූ පදනම හරහා කරුණු දක්වා ඇති ගැටළු සහ ඒවායේ බලපෑම් හැරුණු විට මා විසින් විගණනය සඳහා අවශ්‍ය සියලු කරුණු සහ පැහැදිලි කිරීම් එක්රැස් කරගන්නා ලදී. එසේම එම කරුණු සහ පැහැදිලි කිරීම් ඉතා සාධනීය ලෙස මාගේ වාර්තා තුල යොදාගෙන ඇති අතර එම කරුණු සහ පැහැදිලි කිරීම් පවත්වාගෙන යාම 2007 අංක 07 දරන සමාගම් පනතෙහි 163 (1) (d) කොටසේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (a) කොටසේ දැක්වෙන ප්‍රතිපාදන වලට අනුරූපව සමාගම විසින් පවත්වාගෙන යෑම සිදුකර ඇත.

- ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව වාර්තාව 2007 අංක 07 දරන සමාගම් පනතෙහි 151 කොටසේ දක්වා ඇති ප්‍රතිපාදනවලට අනුකූල වේ.

- ඉදිරිපත් කර ඇති මුල්‍ය තත්ත්ව වාර්තා 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි අංක 6 (1) (d) (iii) කොටසේ දක්වා ඇති ප්‍රතිපාදනවලට අනුකූල වේ.

- පසුගිය වසර සඳහා මා විසින් සම්පාදනය කල සියලු නිර්දේශයන් ඇතුලත් මුල්‍ය තත්ත්ව වාර්තා 2018 අංක 19 ජාතික විගණන පනතෙහි 6 (1) (d) (iv) කොටසේ ප්‍රතිපාදනවලට අනුරූපව සිදුකර ඇත.

සිදු කරන ලද ක්‍රියාපටිපාටීන් සහ ලබාගන්න ලද සාක්ෂි අනුව, පැවති තත්වයන් සියල්ල ප්‍රමාණාත්මක වන අතර අන් කිසිදු තත්වයක් මාගේ විශේෂ අවධානයට යොමු නොවුනි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (d) කොටසේ ප්‍රතිපාදනවලින් බැහැරව සමාගමේ පරිපාලන ව්‍යුහයේ සාමාජිකයකු සෘජුව හෝ වක්‍රව සිදුකරනු ලබන මැදිහත් වීම් හරහා ලබාගන්නා ලද කොන්ත්‍රාත්තු පිලිබඳ සඳහන් කිරීම.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (f) කොටසේ ප්‍රතිපාදනවලට අනුරූපව සමාගමේ පාලන ව්‍යුහය විසින්ඉදිරිපත් කර ඇති සාමාන්‍ය හා විශේෂ විධිවිධාන වලට අමතරව සමාගම විසින් වෙනත් කිසිදු ලිඛිත නීතියක් සම්පාදනය නොකිරීම.

නීති රීති සඳහා වන යොමුව

(අ) 2003 ජූනි 02 දිනට අදාල අංක PED 12
රාජ්‍ය ව්‍යාපාර පිලිබඳ චක්‍රලේඛය

(i)	9.2 (a) කොටස	ආයතනික සටහන් සහ සේවක සංඛ්‍යාව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ මහා භාණ්ඩාගාරය හරහා අනුමත විය යුතුය. නමුත් සමාගම එම අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ගැනීමට අපොහොසත් වී ඇත.
(ii)	9.3.1 කොටස	සියලුම රාජ්‍ය ව්‍යාපාර, සිය අවශ්‍යතා සහ උසස්වීම් පිලිබඳ යෝජනා ක්‍රමයක් පවත්වා ගත යුතුය. නමුත් සමාගම අවශ්‍යතා සහ උසස්වීම් පිලිබඳ යෝජනා ක්‍රමයක් පිහිටුවා නොමැත.
(iii)	2009 අප්‍රේල් 16 දිනට අදාල වූ අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 2 කොටස	පැමිණීම සහ පිටවීම තහවුරු කිරීම සඳහා ඇඟිලි සලකුණු සටහන් කර ගැනීමේ ක්‍රමවේදයක් භාවිත කල යුතුය. නමුත් සමාගම පැමිණීම සහ පිටවීම තහවුරු කර ගැනීම සඳහා ඇඟිලි සළකුණු සටහන් කරගැනීමේ යන්ත්‍රයක් භාවිත නොකරයි.

පැහැදිලි කිරීම

- සමාගම 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි 12 (g) කොටසේ ප්‍රතිපාදනවල දක්වා ඇති පරිදි සමාගමේ බලතල, ක්‍රියාකාරකම් සහ වගකීම් නිසි ආකාරව ඉටුකර නොමැත.

- සමාගම තැන සතු සම්පත් 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි 12 (h) කොටසේ දක්වා ඇති සීමාවන් සහ යෙදවීම් වලට අනුරූපව ආර්ථිකමය වශයෙන් ඵලදායී ලෙස භාවිත කර නොමැත.

ඩබ්. පී . සී. වික්‍රමරත්න
විගණකාධිපති

විගණනය කළ මූල්‍ය ප්‍රකාශය

2018

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය
අංක 28/19, මලලසේකර මාවත, කොළඹ 07

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

	සටහන	2018 රු.	2017 රු.
ආදායම	**04**	**59,779,244**	62,953,972
විකුණුම් පිරිවැය	**05**	**(21,572,552)**	(29,154,623)
දළ ලාභය		**38,206,692**	33,799,349
වෙනත් ආදායම්	**06**	**130,459**	76,738
බෙදාහැරීමේ වියදම්	**07**	**(2,005,942)**	(1,466,631)
පරිපාලන වියදම්	**08**	**(29,017,313)**	(24,832,784)
ශුද්ධ මූල්‍ය ආදායම	**09**	**7,803,967**	6,542,361
ආදායම් බදුවලට පෙර ලාභය/ (පාඩුව)		**15,117,863**	14,119,033
ආදායම් බදු වියදම්	**10**	**247,956**	(1,101,429)
වසර සඳහා ලාභය/ (පාඩුව)		**15,365,819**	13,017,604
කොටසකට ඉපයීම	**11**	**1.08**	0.92

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසක් වෙයි.
වරහන් තුළ වන සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය
අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07

මූල්‍ය තත්ව ප්‍රකාශය

	සටහන	**31.12.2018** රු	31.12.2017 රු (Restated)
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	**12**	**1,373,551**	1,649,262
බදු කුලිය	**13**	**23,170,821**	24,825,880
විලම්භිත බදු වත්කම්	**14**	**7,630,698**	7,382,742
මුළු ජංගම නොවන වත්කම්		**32,175,070**	33,857,884
ජංගම වත්කම්			
වෙළෙඳ සහ වෙනත් ලැබීම්	**15**	**9,105,818**	8,344,585
වෙනත් මූල්‍ය වත්කම්	**16**	**84,011,006**	68,846,070
අයකරගත හැකි ජංගම බදු	**17**	**4,675,331**	4,172,925
මුදල් හා මුදල් සමාන දෑ	**18**	**354,721**	448,790
මුළු ජංගම වත්කම්		**98,146,876**	81,812,370
මුළු වත්කම්		**130,321,946**	115,670,254
ස්කන්ධ			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	**19**	**142,065,090**	142,065,090
සමුච්චිත ලාභය/(පාඩුව)		**(24,494,297)**	(39,641,902)
මුළු ස්කන්ධ		**117,570,793**	102,423,188
Non-Current Liabilities			
පොළී දරන ණය	**20**	**-**	3,206,160
සේවක ප්‍රතිලාභ	**21**	**2,657,995**	1,282,875
මුළු ජංගම නොවන බැරකම්		**2,657,995**	4,489,035
Current Liabilities			
පොළී දරන ණය	**20**	**3,206,160**	3,206,160
වෙළෙඳ සහ වෙනත් ගෙවීම්	**22**	**3,764,888**	4,404,642
ලැබුණු අත්තිකාරම්	**23**	**3,122,110**	234,260
ගෙවිය යුතු ආදායම් බදු		**-**	912,969
මුළු ජංගම බැරකම්		**10,093,158**	8,758,031
මුළු ස්කන්ධ සහ බැරකම්		**130,321,946**	115,670,254

මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනුයේ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ටඅනුකූලවයි.

....
මූල්‍ය කළමනාකරු **ප්‍රධාන විධායක නිලධාරී**

මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ ඉදිරිපත් කිරීමසම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලදුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරනු ලබන්නේ

....
සභාපති **අධ්‍යක්ෂ** **අධ්‍යක්ෂ**

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසක් වෙයි.

වරහන් තුළ වන සංඛ්‍යා අඩු කිරීම් පන්නුම්කරයි

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය
අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07

2018 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.	සමුච්චිත ලාභය / (පාඩුව) රු. (යළි ප්‍රකාශිත)	මුළු ස්කන්ධය රු. (යළි ප්‍රකාශිත)
2017 ජනවාරි 1 වන දිනට ශේෂය	142,065,090	(53,942,220)	88,122,870
යළි ප්‍රකාශිත බදු කුළිය (සටහන අ	-	1,282,714	1,282,714 -
වසර සඳහා වන මුළු විස්තීර්ණ ආදායම	-	13,017,604	13,017,604
2017 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	142,065,090	(39,641,902)	102,423,188
2018 ජනවාරි 1 වන දිනට ශේෂය	**142,065,090**	**(39,641,902)**	**102,423,188**
පෙර වසරේ ගැලපුම (සටහන ආ)	**-**	**(218,214)**	**(218,214)**
වසර සඳහා වන මුළු විස්තීර්ණ ආදායම	**-**	**15,365,819**	**15,365,819**
2018 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	**142,065,090**	**(24,494,297)**	**117,570,793**

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසක් වෙයි.
වරහන් තුළ වන සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම්කරයි

සටහන අ - යළි ප්‍රකාශිත බදු කුළිය	**Rs.**
SLIDA ගිවිසුම අනුව බදු වත්කම් ක්‍රමක්ෂය ගැලපීම	**(1,902,645)**
SLIDA ගිවිසුම අනුව බදු වත්කම් අගය ගැලපීම	**3,185,359**
	1,282,714

සටහන ආ - පෙර වසරේ ගැලපීම	**Rs.**
2017 වසරේ අඩුකර දැක්වූ පොළී ආදායම ලෙස වාර්තා කිරීම	**(206,676)**
2017 වසරේ නිවැරදි කළ ක්ෂය වෙනස	**26,208**
2017 වසරේ නිවැරදි කළ ආදායම් බදු වෙනස	**(37,746)**
	(218,214)

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය
අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07

2018 දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය තත්ව ප්‍රකාශය

	2018	2017
	රු	**රු**
මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහ		
ආදායම් බදු වියදම්වලට පෙර ලාභය/ (පාඩුව)	**15,117,863**	14,112,211
ගැලපුම්		
දේපළ, පිරියත සහ උපකරණ මත ක්ෂයවීම්	**1,033,040**	903,549
ලැබිය යුතු WHT කපාහැරීම්	**695,487**	-
පාරිතෝෂික ප්‍රතිපාදන	**1,375,120**	-
බදු කුළී ක්‍රමක්ෂය	**1,655,059**	1,548,880
මූල්‍ය පිරිවැය	**56,108**	98,317
පොළී ආදායම	**(8,066,751)**	(6,572,439)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	**11,865,926**	10,090,518
වෙළෙඳ සහ අනෙකුත් ලැබීම් (වැඩිවීම)/ අඩුවීම	**(588,545)**	1,017,695
වෙළෙඳ සහ අනෙකුත් ගෙවීම් වැඩිවීම / (අඩු වීම)	**(639,754)**	3,122,887
.ජංගම බදු ලැබීම් (වැඩිවීම)/ අඩුවීම	**2,887,851**	-
	13,525,479	14,231,100
මෙහෙයුම්වලින් උත්පාදනය වූ මුදල්		
ESC Paid	**(247,530)**	-
ගෙවූ රඳවා ගැනීමේ බදු	**(466,140)**	(266,237)
රජයේ ණය සඳහා ගෙවූ පොළිය	**(56,108)**	(98,317)
ගෙවූ ආදායම් බදු	**(1,434,938)**	(234,544)
මෙහෙයුම් කටයුතුවලින්/(තුළ භාවිතා කළ) ශුද්ධ මුදල්	**11,320,762**	13,632,002
ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහ		
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම	**(731,122)**	(65,000)
ස්ථාවර තැන්පතු තුළ ආයෝජනය	**(15,164,936)**	(16,857,722)
ලැබුණු පොළිය	**7,687,387**	6,572,439
ආයෝජන කටයුතු තුළ භාවිතා කළ ශුද්ධ මුදල්	**(8,208,672)**	(10,350,283)
මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහ		
වසර තුළ නැවත ගෙවන ලද ණය	**(3,206,160)**	(3,206,160)
මූල්‍ය කටයුතුවල භාවිතා කළ ශුද්ධ මුදල්	**(3,206,160)**	(3,206,160)

මුදල් සහ මුදල් සමාන දෑ තුළ ශුද්ධ වැඩිවීම	**(94,069)**	75,559
වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	**448,790**	373,231
වසර අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ (සටහන අ)	**354,721**	448,790

සටහන අ - මුදල් සහ මුදල් සමාන දෑ	**As at 31.12.2018**	As at 31.12.2017
	රු	**රු**
බැංකුවේ ඇති මුදල - ලංකා බැංකුව ඵ ගිණුම් අංකය 0002323189	**329,721**	423,790
අතැති මුදල	**25,000**	25,000
	354,721	448,790

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසක් වෙයි.
වරහන් තුළ වන සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2018

1. වාර්තාකරන අස්තිත්වය

සීමාසහිත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත මෙන්ම එහි නිත්‍ය වාසය කොටගත් රජයේ සීමිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07 ලිපිනයෙහි පිහිටා තිබේ.

ගෝලීය දුරස්ථ ඉගෙනුම් ජාලය භාවිතා කොට විශේෂයෙන්ම රාජ්‍ය කළමනාකරණය සහ ආර්ථික සංවර්ධනය යන ක්ෂේත්‍රයන්හි ජාත්‍යන්තර මට්ටමේ විශේෂඥයින් සමග අන්තර් ක්‍රියාකාරීත්වය ඇතිකරගැනීම සඳහා යාවත්කාලීන තොරතුරු සහ අවස්ථාවන් වෙත ප්‍රවේශය ලබාගැනීමට රාජ්‍ය හා පෞද්ගලික අංශ සේවකයින් සඳහා පහසුකම් ලබාදීම වෙනුවෙන් වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු, සමුළු සහ අනෙකුත් ක්‍රියාකාරකම් සංවිධානය කිරීම සහ පැවැත්වීම සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වේ.

2. සකස් කිරීම සඳහා පදනම

2.1 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්වයන් සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවන ලද ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්වලට අනුකූලව හා 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවන්ට අනුව සකස් කරන ලද විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය, සම කොටස්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමග මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සහ වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති යනාදිය සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළ අන්තර්ගත වේ.

කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්වලට අනුකූලව සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන.

2.2 මැනුම් සඳහා පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පදනම්ව සකස් කර ඇති අතර මූල්‍ය ප්‍රකාශනවලට බලපෑම් ඇති කෙරෙන උද්ධමන සාධක සඳහා ගැළපුම් රහිතව ගිණුම්කරන ප්‍රතිපත්ති සංගත ලෙස යොදාගනු ලැබේ.

පූර්වේක්ෂ්‍ය අනාගතයේදී ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් අඛණ්ඩව පැවතීමට සමාගම සතු හැකියාව පිළිබඳ ඇගයීමක් අධ්‍යක්ෂකවරුන් විසින් සිදු කොට ඇති අතර එයට අනුව ක්‍රියාකාරකම් ඈවරකිරීම හෝ අවසන් කිරීම සඳහා අවශ්‍යතාවක් ඔවුන් දකින්නේ නැත.

2.3 කාර්යබද්ධ සහ ඉදිරිපත්කිරීමේ ව්‍යවහාර මුදල්

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ සමාගමේ කාර්යබද්ධ ව්‍යවහාර මුදල් වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

2.4 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතය

කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේදී, ගිණුම්කරන ප්‍රතිපත්ති යොදාගැනීම සහ වත්කම්, බැරකම්, ආදායම් හා වියදම්වල වාර්තාගත ප්‍රමාණයන් කෙරෙහි බලපානු ලබන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදුකිරීමට කළමනාකාරිත්වයට සිදුවේ.

ඉතිහාසය පිළිබඳ අත්දැකීම් සහ ඒ ඒ වාතාවරණයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන අපේක්ෂාවන් ඇතුළු අනෙකුත් සාධක මත පදනම්ව විනිශ්චයන් සහ ඇස්තමේන්තු සිදු කෙරේ. එබැවින් සත්‍ය ප්‍රතිඵල මෙම විනිශ්චයන් සහ ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක වන උපකල්පන අඛණ්ඩව සිදු කෙරෙන පදනමින් සමාලෝචනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංශෝධන ඇස්තමේන්තු සංශෝධනය කෙරෙන කාලසීමාව තුළදී සහ බලපෑමට ලක්වන ඕනෑම ඉදිරි කාලසීමාවන් තුළදී හඳුනාගැනේ.

3. වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති

පහත දක්වා ඇති ගිණුම්කරන ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කර තිබෙන සියලු කාල පරිච්ඡේද සඳහා සංගත ලෙස යොදා ගෙන ඇත. එහි අරමුණ වනුයේ, නිශ්චිත වශයෙන් දක්වා ඇති අවස්ථාවන් හැර කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්ති වෙත පරිවර්තනය කිරීම සඳහාය.

අස්තිත්වය විසින් ගිණුම්කරන ප්‍රතිපත්ති සංගත ලෙස යොදා ගෙන ඇත.

3.1 විදේශ මුදල් ගණුදෙනු

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, අස්තිත්වයේ කාර්යබද්ධ ව්‍යවහාර මුදල් හැර අනෙකුත් ව්‍යවහාර මුදල්වලින් (විදේශ මුදල්) සිදුකෙරෙන ගණුදෙනු, එම ගණුදෙනු සිදුකෙරෙන දිනවලදී පවතින විනිමය අනුපාතික භාවිතා කොට කාර්යබද්ධ ව්‍යවහාර මුදලින් වාර්තා කෙරේ.

සෑම වාර්තාකරන දිනයකදීම, විදේශ මුදල්වලින් ඉදිරිපත් කෙරෙන මූල්‍ය අයිතම පියවුම් අනුපාතිකයට අනුව පරිවර්තනය කෙරේ. සාධාරණ වටිනාකමට අනුව මිනුම් කරන ලද මූල්‍යමය නොවන අයිතම, සාධාරණ වටිනාකම තීරණය කරන ලද දිනයේ පවතින අනුපාතිකවලට අනුව පරිවර්තනය කෙරේ. ඓතිහාසික පිරිවැය අනුව මිනුම් කරන ලද මූල්‍යමය නොවන අයිතම ගණුදෙනු සිදු කෙරෙන දිනවල පවතින අනුපාතිකවලට අනුව පරිවර්තනය කෙරේ.

මූල්‍ය අයිතම බේරුම් කිරීම් සහ මූල්‍ය අයිතම පරිවර්තනය මත පැන නඟින විනිමය අන්තරය, කාල පරිච්ඡේදය සඳහා වන ලාභ හෝ පාඩු තුළ අන්තර්ගත කෙරේ.

සාධාරණ වටිනාකම දරන මූල්‍යමය නොවන අයිතම පරිවර්තනය මත පැන නඟින විනිමය අන්තරයන් කාල පරිච්ඡේදය සඳහා වන ලාභ හෝ පාඩු තුළ අන්තර්ගත කෙරෙන අතර අනෙකුත් විස්තීරණ ආදායම තුළ හඳුනාගැනෙන අන්තරයන් මෙහිදී බැහැර කෙරේ.

3.2 වත්කම් සහ ඒවායේ තක්සේරුව සඳහා පදනම් වන කරුණු

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය තුළ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරන ලද වත්කම් යනු මුදල්, බැංකු ශේෂ සහ සමාගමේ හෝ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය අතරතුර හෝ වාර්තාකරන දින සිට වසරක් ඇතුළත හෝ යන දෙකෙන් කෙටි කාලය තුළ මුදලින් උපලබ්ධි කිරීමට අපේක්ෂා කෙරෙන දෑ වේ. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් වනුයේ වාර්තාකරන දින සිට වසරක කාලයකට එහා සමාගම විසින් තබා ගැනීමට අදහස් කරනු ලබන දෑ වේ.

3.2.1 දේපළ, පිරියත හා උපකරණ

3.2.1.1 හඳුනාගැනීම හා මිනුම් කිරීම

දේපළ, පිරියත හා උපකරණ, පිරිවැය අඩු කරන ලද සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානි අලාභ වලදී ප්‍රකාශ කෙරේ.

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක තිබෙන කොටස් විවිධ ආයු කාලවලින් ප්‍රයෝජනයට ගත හැකි වන්නේ නම්, ඒවා දේපළ, පිරියත සහ උපකරණ වෙන වෙනම අයිතම (ප්‍රධාන සංරචක) ලෙස ගණන් ගැනේ. දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් නිශ්කාෂණය කිරීමෙන් වන ලාභ හා පාඩු, නිශ්කාෂණය කිරීමෙන් ලැබෙන මුදල්, දේපළ, පිරියත හා උපකරණවල ධාරණ ප්‍රමාණය සමග සන්සන්දනය කිරීමෙන් තීරණය කෙරෙන අතර අනෙකුත් ආදායම තුළ ලාභ හෝ පාඩු වල ශුද්ධ අගයක් ලෙස හඳුනාගැනේ.

3.2.1.2 ක්ෂය

වත්කමක පිරිවැය හෝ පිරිවැය සඳහා ආදේශ කරන අනෙක් ප්‍රමාණය (එහි අවශිෂ්ට වටිනාකම රහිතව) වන ක්ෂය විය හැකි ප්‍රමාණය මත ක්ෂය ගණනය කෙරේ. දේපළ, පිරියත හා උපකරණ අයිතමයක ඒ ඒ කොටසේ ඇස්තමේන්තු කරන ලද ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලයන් මත සරල රේඛීය පදනමකින් ක්ෂයවීම් ලාභ හෝ පාඩු තුළ හඳුනාගැනේ. ඒ, මෙය, වත්කම තුළ ගැබ්ව පවතින අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීම සම්බන්ධයෙන් අපේක්ෂිත රටාව ඉතා සමීපව පිළිබිඹු කරන බැවිනි.

වත්මන් සහ සාපේක්ෂ කාල පරිච්ඡේදය සඳහා ඇස්තමේන්තු කරන ලද ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලයන් පහත පරිදි වේ.

වත්කම් කාණ්ඩය	ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය (වසර)	ක්ෂයවීමේ ශීඝ්‍රතාව (%)
පරතරයන් අවම කිරීමේ හා ඉගැන්වීමේ උපකරණ	5	20
පරිගනක උපකරණ	4	25
මෝටර් රථ	5	20
කාර්යාල උපකරණ	5	20
ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	5	20

වත්කමක ක්ෂයවීම ආරම්භ වනුයේ එය භාවිතයට ගැනීමට ලැබෙන අවස්ථාවේදී වන අතර වත්කමක ක්ෂයවීම නතර වනුයේ වත්කම, අලෙවිය සඳහා රඳවාගත් යනුවෙන් වර්ගීකරණය වන දිනය සහ වත්කම වත්කමක් ලෙස හඳුනා නොගැනෙන දිනය යන දෙකෙන් කලින් එලැඹෙන දිනයේ වේ.

ක්ෂයවීමේ ක්‍රමය, ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය සහ අවශිෂ්ට වටිනාකම සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කෙරෙන අතර සුදුසු නම්, ගැලපුම් කෙරේ.

3.3 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කෙරෙන වගකීම් යනු, ඉල්ලූ විට හෝ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ දින සිට වසරක් ඇතුළත හෝ ගෙවිය යුතු වන ගෙවීම්ය. ජංගම නොවන වගකීම් යනු, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ දින සිට වසරකට පසු ගෙවිය යුතු වන ශේෂයන් වේ. හඳුනාගත් සියලු වගකීම් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගණන් ගැනී ඇත.

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන්, විශ්වස්‍ය ලෙස ඇස්තමේන්තු කළ හැකි නෛතික හෝ සම්මුතික බැඳීමක් සමාගම සතුව වර්තමානයේ පවතී නම් සහ එම බැඳීම බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා යෑමක් අවශ්‍ය විය හැකි වන්නේ නම් එහිදී ප්‍රතිපාදනයක් හඳුනාගැනේ.

3.3.1 සේවක ප්‍රතිලාභ

3.3.1.1 නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු පශ්චාත්-සේවක ප්‍රතිලාභ සැලැස්මක් වන අතර ඒ යටතේ යම් අස්තිත්වයක් විසින් වෙනම අස්තිත්වයක් වෙත ස්ථාවර දායකත්ව මුදලක් ගෙවනු ලබන අතර ඉන් ඉදිරියට වෙනත් කිසිදු මුදලක් ගෙවීමට නෛතික හෝ සම්මුතික බැඳීමක් එම අස්තිත්වයට ඇත්තේ නැත. නිශ්චිත දායකත්ව විශ්‍රාම වැටුප් සැලසුම් වෙත දායක වීම සඳහා වන බැඳීම්, සේවකයින් විසින් සේවාවන් සපයනු ලබන කාල සීමාවන් තුළදී සේවක ප්‍රතිලාභ වියදමක් ලෙස ලාභ හෝ පාඩු තුළ හඳුනාගැනේ.

සේවකයින්ගේ දළ පඩිනඩි වලින් 12%ක් සමාගම විසින් සේවක අර්ථසාධක අරමුදල වෙත දායක කෙරේ.

සියලුම සේවකයින් සේවක භාර අරමුදල සඳහා සුදුසුකම් ලබන අතර එම සේවකයින්ගේ දළ පඩිනඩිවලින් 3%ක් සමාගම විසින් එම අරමුදලට දායක කෙරේ.

3.3.1.2 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිකය

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු, නිශ්චිත දායකත්ව සැලැස්මකට පරිබාහිර වූ පශ්චාත්-සේවක ප්‍රතිලාභ සැලැස්මකි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යටතේ, වත්මන් සහ පෙර සිටි සේවකයින් වෙත ගිවිසි ප්‍රතිලාභය ලබාදීමට අස්තිත්වය බැඳී සිටී.

වත්මන් සේවකයින් විසින් අනාගතයේ කරනු ලබන සේවාවන් නොසලකා හැරීම, ඇස්තමේන්තු කරන ලද අනාගත වැටුප් වැඩිවීම් නොසලකා හැරීම සහ වාර්තා කරන දිනය සහ සේවකයින් පශ්චාත් සේවක ප්‍රතිලාභ ලැබීම ඇරඹීමට අපේක්ෂිත දිනය අතර වත්මන් සේවකයින් සේවයේ යෙදී සිටියදී සිදුවිය හැකි මර්ත්‍යතාව නොසලකා හැරීම යනාදී වශයෙන් කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්ති- "සේවක ප්‍රතිලාභ" හි 28 වන වගන්තිය මගින් අවසර ලබා දී ඇති සරලකිරීම භාවිතා කොට සේවය අරඹන දිනයේ සිට සේවය කරන සෑම වසරක් සඳහාම ආයුගණක තක්සේරුකරණය රහිතව අඩ මසක වැටුපට, නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් සැලැස්ම සඳහා සමාගමේ ශුද්ධ බැඳීම ගණනය කෙරේ.

කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්ති - "සේවක ප්‍රතිලාභ" හි 28 වන වගන්තියට අනුකූලව සියලු සේවකයින් සඳහා සේවයේ පළමු වසරේ සිට විශ්‍රාම පාරිතෝෂික සඳහා විවිධාන සලසා ඇත. කෙසේවුවද, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ සේවකයෙකු වෙත පාරිතෝෂිකය ගෙවීම සඳහා වන බැඳීම මතු වනුයේ සේවකයා විසින් වසර 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළහොත් පමණක් වන අතර සේවක සංඛ්‍යාව 15 ට වඩා අඩු නම්, එවැනි සේවකයින් සඳහා පාරිතෝෂිකය ගෙවීම විධානාත්මක නොවේ. බැඳීම බාහිරව අරමුදල් සැපයෙන්නකි.

3.3.2 ප්‍රාග්ධන බැඳීම් හා අවිනිශ්චිතතාවන්

අවිනිශ්චිතතාවන් යනු පසුගිය සිදුවීමක් හේතුවෙන් ඇති වූ දේපළ හෝ බැඳීම් විය හැකි අතර ඒවා තහවුරු වන්නේ සමාගමේ පාලනයෙන් බැහැර වූ අවිනිශ්චිත අනාගත සිදුවීම් ඇති වීම හෝ ඇති නොවීම මත පමණි.

3.4 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා වියදම් ක්‍රමයේ ක්‍රියාකාරීත්වය මගින් සමාගමේ කාර්යසාධනයෙහි ලක්ෂණ සාධාරණව ඉදිරිපත් කරන බැවින් එවැනි ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් සුළු හා මධ්‍යම පරිමාන ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි 3 කොටසෙහි ප්‍රතිපාදනවලට එනම් "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" අනුව යොදා ගැනෙන බවයි.

3.4.1 ආදායම් හඳුනාගැනීම

සමාගම වෙත ආර්ථික වාසි ලැබෙන ලෙස සහ ආදායම හා දැනටමත් දරා ඇති හෝ දැරීමට නියමිත ආශ්‍රිත පිරිවැය විශ්වසනීය ලෙස මැන ගැනීමට හැකි වන ලෙස ආදායම් හඳුනා ගැනේ. සංශෝධිත හෝ සංශෝධනය කළ හැකි ගෙවීම්හි සාධාරණ අගය, ශුද්ධ වෙළඳ වට්ටම් හා ආදායමට අදාළ බදු අනුව ආදායම මැන බලනු ලැබේ. ආදායම් හඳුනා ගැනීම සඳහා පහත දැක්වෙන නිශ්චිත වූ නිර්ණායක යොදා ගනු ලැබේ.

3.4.1.1 සේවාවන් සැපයීම

සේවාවන් සැපයීමට අදාළ ගණුදෙනු තුළින් ලැබෙන ආදායම වාර්තා කිරීමේ කාලය අවසානයේ ගණුදෙනුව සම්පූර්ණ කිරීමේ අදියරට අදාළව හඳුනා ගනු ලබයි. නිශ්චිත කාල සීමාවක් තුළ අනියත වාර ගණනක් සේවාවන් සැපයූ විට සමාගම විසින් නිශ්චිත වූ කාල සීමාව තුළ සෘජු රේඛීය පදනමක් මත ආදායම හඳුනා ගනු ලබන අතර නිශ්චිත වූ කටයුත්තක් වෙනත් කටයුත්තකට වඩා වැදගත් වන විට වැදගත් කටයුත්ත සිදු කරන තුරු සමාගම විසින් ආදායම හඳුනා ගැනීම කල් දමනු ලැබේ.

3.4.1.2 පොළී ආදායම

රැස් කර ගැනීම පිළිබඳ සැකයක් නොමැත්තේ නම් පොළී ආදායම ලද පොළිය (වත්කම්වලින් ලද ඵලදායී ආදායම සැලකිල්ලට ගෙන) ලෙස හඳුනා ගනු ලැබේ.

3.4.1.3 වෙනත් ආදායම්

අනෙකුත් සියළු ආදායම් උපචිත පදනම මත හඳුනා ගනු ලැබේ.

3.4.2 වියදම් හඳුනා ගැනීම

3.4.2.1 මෙහෙයුම් වියදම්

ව්‍යාපාරයේ දෛනික මෙහෙයුම් කටයුතු සිදු කිරීමේ දී හා දේපළ, පිරියත හා උපකරණ නඩත්තු කිරීමේදී දැරීමට සිදු වන වියදම් වසරට අදාළ ලාභය/ (පාඩුව) ගණනය කිරීමේදීවිස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කර ඇත. වෙළඳ ලැබීම් අඩුවීම, ප්‍රකාශිත බැරකම් හා දේපළ, පිරියත හා උපකරණවල වටිනාකම අඩුවීම සඳහා ද ප්‍රතිපාදන සලසා ඇත.

3.4.2.2 මූල්‍ය පිරිවැය

මූල්‍ය පිරිවැය රාජ්‍ය ණය හා බැංකු අයිරාවලට අදාළ පොළී වියදම්වලින් සමන්විත වේ.ලාභයට හා අලාභයට අදාළව සියළු ණය පිරිවැය සළුල පොළී ක්‍රමය භාවිතා කර හඳුනා ගැනේ.

3.4.2.3 බදු වියදම්

ආදායම් බදු වියදම් ජංගම හා විලම්භිත බදුවලින් සමන්විත වේ. සමකොටස්හි සෘජුව හඳුනාගෙන ඇති අයිතම හැර ආදායම් බදු වියදම විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති අතර එවැනි අවස්ථාවල ඒවා සමකොටස් තුළ හඳුනා ගැනේ.

3.4.2.3.1 ජංගම බදු

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත හා පසුව සම්මත කර ගන්නා ලද පනත් මගින් සංශෝධනය කරන ලද හෝ වාර්තා කරනු ලබන දිනය වන විට නිත්‍ය ලෙස පනවන ලද නීතිවලට අදාළ ප්‍රතිපාදන අනුව ඇගයීමට ලක් කරන ලද වසර සඳහා ගණනය කරන ලද බදු පැනවිය හැකි ආදායම මත දේශීය ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවන ලද හෝ ගෙවීමට අපේක්ෂිත මුදල අනුව වර්තමාන හා සන්සන්දනාත්මක කාල සීමාවන් සඳහා ජංගම බදු වියදම ගණනය කරනු ලැබේ.

3.4.2.3.2 විලම්භිත බදු පැනවීම

මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා සඳහා ඉදිරියට ගෙන යන වත්කම් හා බැරකම් ප්‍රමාණය සහ ඉදිරියේ දී ආපසු හැරවීමට අපේක්ෂිත පරිදි බදු පැනවීම සඳහා යොදා ගැනෙන ප්‍රමාණයන් අතර වන තාවකාලික වෙනස්කම්වලට අදාළව ශේෂ පත්‍ර වගකීම් ක්‍රමය භාවිතා කර විලම්භිත බදු පැනවීම හඳුනා ගැනේ.

වාර්තා කරනු ලබන දින වන විට පනවන ලද හෝ නිත්‍ය ලෙස පනවන ලද නීති මත පදනම්ව ආපසු හරින ලද තාවකාලික බදු වෙනසට අදාළ කර ගැනීමට අපේක්ෂිත බදු අනුපාතයන් අනුව විලම්භිත බදු ගණනය කෙරේ.

ඉදිරියේ දී බදු පැනවිය හැකි ලාභයක් ඇති විය හැකි වන පරිදි දැනට ඉතිරි බදු අලාභ, බදු බැර හාඇඩු කළ හැකි තාවකාලික බදු වෙනස සඳහා විලම්භිත බදු වත්කම හඳුනා ගැනේ. විලම්භිත බදු සෑම වාර්තා කරනු ලබන දිනයක දී ම සමාලෝචනය කෙරෙන අතර තවදුරටත් අදාළ බදු ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වන ප්‍රමාණයට අඩු කෙරේ.

ජංගම බදු බැරකම්වලට එරෙහිව ජංගම බදු වත්කම් හිලව් කිරීම සඳහා නෛතිකව ක්‍රියාත්මක කළ හැකි හිමිකමක් ඇත්නම් සහ විලම්භිත බදු එකම බදු පැනවිය හැකි අස්තිත්වය හා එකම බදු පැනවීමේ අධිකාරයට සම්බන්ධ නම් විලම්භිත බදු වත්කම් හා විලම්භිත බදු බැරකම් හිලව් කරනු ලැබේ.

3.5 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය සකස් කරන ලද්දේ "වක්‍ර ක්‍රමය" භාවිතා කොටගෙනය. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා ගෙවන ලද පොළිය මෙහෙයුම් මූල්‍ය ප්‍රවාහ ලෙස ද ලද පොළිය ආයෝජන මූල්‍ය ප්‍රවාහ ලෙස ද වර්ග කෙරේ.

3.6 සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

ගාස්තුවක් අය කරන්නේ ද නැතිද යන්න පිළිබඳ නොසලකා එක් පාර්ශවයකට අනෙක් පාර්ශවයේ මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිපත්ති/ තීරණ පාලනය කිරීම හෝ ඒවා කෙරෙහි සැලකිය යුතු බලපෑමක් එල්ල කිරීමට හැකියාව ඇති ගණුදෙනු පිළිබඳ හෙළිදරව් කරන ලදී.

3.7 කොටසක ඉපැයීම්

සමාගම විසින් එහි සාමාන්‍ය කොටස් සඳහා කොටසක මූලික ඉපැයීම් (EPS)දත්ත ඉදිරිපත් කරනු ලැබේ. කොටසක මූලික ඉපැයීම් ගණනය කරනු ලබන්නේ සමාගමේ සාමාන්‍ය කොටස්කරුවන්ට අදාළ ලාභය හෝ අලාභය අදාළ කාල සීමාව තුළ සාමාන්‍ය කොටස්හි බර තැබූ සාමාන්‍යයෙන් බෙදීම මගිනි.

3.8 වාර්තා කරනු ලබන කාල සීමාවෙන් පසුව සිදු වූ සිදුවීම්

වාර්තා කරන කරනු ලබන කාල සීමාව අවසානය හා නිකුත් කිරීම සඳහා අවසර ලද මූල්‍ය ප්‍රකාශනවල දිනය අතර කාලය තුළ සිදු වූ යහපත් හා අයහපත් සිදුවීම් වාර්තා කරනු ලබන කාල සීමවට පසුව සිදු වූ සිදුවීම් වේ. වාර්තා කරනු ලබන කාල සීමාවට පසුව සිදු වූ සිදුවීම්වල භෞතික ප්‍රතිඵල පිළිබඳ සැලකිල්ලට ගෙන අවශ්‍ය පරිදි මූල්‍ය ප්‍රකාශයන්ට යෝග්‍ය වෙනස්කම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය
අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07

මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන් - 2018

සටහන 04 - ආදායම

	2018	2017
	රු	රු
පරිගණක පදනම් කර ගත් පුහුණු	**21,554,516**	20,328,587
පුද්ගලාභිමුඛ පුහුණු	**30,529,592**	33,938,841
වීඩියෝ සම්මන්ත්‍රණ	**3,643,012**	2,662,939
පහසුකම් මත පදනම් නොවූ ආදායම	**4,052,124**	6,023,605
	59,779,244	62,953,972

සටහන 05 - විකුණුම් පිරිවැය

	රු	රු
මුළු වැඩසටහන් පිරිවැය	**21,572,552**	29,130,395
	21,572,552	29,130,395

සටහන 06 - වෙනත් ආදායම්

	රු	රු
විනිමය ලාභය/(අලාභය)	**130,459**	(99,961)
විවිධ ආදායම්	**-**	176,699
	130,459	76,738

සටහන 07 - බෙදාහැරීමේ වියදම

	රු	රු
ප්‍රචාරණය	**10,000**	10,000
විකුණුම් ප්‍රවර්ධනය	**88,720**	23,530
විකුණුම් දිරිදීමනා	**455,652**	402,887
ක්ෂේත්‍ර විකුණුම් දිරිදීමනා	**1,305,000**	910,000
බොල් සහ අඩමාණ ණය	**16,320**	-
ප්‍රවාහන දීමනාව - සම්බන්ධීකාරක	**130,250**	120,214
	2,005,942	1,466,631

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය
අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07

මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන්- 2018

සටහන 08 - පරිපාලන වියදම්	**2018**	2017
	රු	රු
වැටුප්	**10,310,538**	9,120,845
සේවක අර්ථසාධක අරමුදල	**1,239,080**	1,095,446
සේවක භාරකාර අරමුදල	**309,770**	274,492
අතිකාල	**553,802**	692,107
දිරි දීමනා	**575,512**	572,243
පුහුණු හා සංවර්ධන ගාස්තු	**26,441**	81,424
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	**1,375,120**	-
කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා වන වියදම්	**6,800**	41,900
කාර්ය මණ්ඩලය සඳහා විශේෂ ගෙවීම්- සටහන 8.1	**148,500**	108,000
කාර්ය මණ්ඩලය සඳහා විශේෂ ගෙවීම්-ප්‍රතිපාදන - සටහන 8.2	**416,500**	442,000
අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහ සහභාගිවීමේ ගාස්තු - සටහන 24.1	**640,000**	543,970
අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වියදම්	**99,160**	69,420
කාර්ය මණ්ඩල සුභසාධනය	**53,430**	39,270
දුරකථන	**308,780**	290,769
විදුලිය	**4,296,431**	4,507,488
ජලය	**24,684**	-
අන්තර්ජාල ගාස්ත	**170,107**	205,420
විද්‍යුත් තැපෑල සැකසීමේ ගාස්තු	**30,483**	-
ප්‍රවාහනය	**88,616**	69,754
ඉන්ධන - සමාගම් යතුරු පැදිය	**32,200**	41,657
ඉන්ධන - ප්‍රධාන විධායක නිලධාරී	**306,000**	306,000
ප්‍රධාන විධායක නිලධාරී සඳහා වාහන දීමනාව	**600,000**	600,000
මුද්‍රණය හා ලිපි ද්‍රව්‍ය පිරිවැය	**197,543**	149,115
පුවත්පත් හා සඟරා වියදම්	**36,970**	36,750
උපකරණ නඩත්තු කිරීම	**605,126**	740,350
ගොඩනැගිලි නඩත්තු කිරීම	**851,954**	849,436
යතුරුපැදි නඩත්තු කිරීම	**61,964**	25,770
වෙනත් වත්කම් නඩත්තුව	**-**	9,768
ගෘහ භාණ්ඩ නඩත්තුව	**14,350**	49,320
සෞඛ්‍ය රක්ෂණය	**241,763**	177,990
යතුරුපැදි රක්ෂණය	**10,462**	10,781
ගිනි රක්ෂණය	**58,854**	60,899
ක්ෂය වීම	**1,033,040**	903,549
බදු කුළිය ක්‍රමක්ෂයය	**1,655,059**	1,548,880
පවිත්‍ර කිරීමේ ගාස්තු	**686,409**	650,552
විගණන ගාස්තසටහන 8.3	**495,524**	146,426

දායකත්ව	**-**	24,288
වෘත්තීය ගාස්ත	**30,000**	50,000
ලේකම් ගාස්තු	**163,805**	146,288
අනියම් කම්කරුවන්	**-**	3,500
බැංකු ගාස්තු	**21,155**	26,776
කාර්ය මණ්ඩලයේ තේ සඳහා වන වියදම	**62,105**	67,643
වෙනත් වියදම්	**-**	6,360
පරිවර්තන ගාස්තු	**39,085**	46,138
විදේශ ගමන්	**264,243**	-
ඡායාපිටපත් යන්ත්‍ර කුලිය	**180,462**	-
ලැබිය යුතු නැවත ලබාගත නොහැකි රඳවාගැනීම් බදු ප්‍රතිපාදන සටහන 8.4	**695,488**	-
	29,017,313	24,832,784

සටහන 8.1

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 03/2018 අනුව එක් සේවකයෙකුට රු13,500/- බැගින් ගෙවන ලදී

සටහන 8.2

මෙහෙයුම් පිරිවැය මත පදනම්ව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කළ සූත්‍රයට අනුව විශේෂ ගෙවීම් සඳහ ප්‍රතිපාදන සැලසීම.

සටහන 8.3. **විගණන ගාස්තු**

2017 සඳහ අභ්‍යන්තර විගණන ගාස්තු (B. R. De Silva Co.)	**60,996**
විගණකාධිපති සඳහ බාහිර විගණන ගාස්තු 2015 /2016 /2017	**434,528**
	495,524

සටහන 8.4

රඳවාගැනීමේ බදු මුදල වන රු. 4,172,925 සමුච්චගත කරගන්නා ලද්දේ දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ විවිධ සැපයුම්කරුවන් සහ පාරිභෝගිකයින් විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට බැර කරන ලද රඳවාගැනීම් සහ වාණිජ බැංකුවලින් කෙටි කාලීන ආයෝජනවල පොළියේ ආදායම් මූලාශ්‍රවලින් රඳවාගැනීම් බදු අඩු කිරීමෙනි.

කෙසේ වෙතත් මෙම සමුච්චිත රඳවාගැනීමේ බද්ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් හඳුනාගෙන නොමැති අතර ලැබිය යුතු රඳවාගැනීම් බදු නැවත ලබාදෙන මෙන් ඉල්ලීම් ගණනාවක් සිදු කර ඇත. එහෙත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් මෙය නිසි ලෙස පිළිගෙන නොමැත. එනිසා මේ සම්බන්ධ අවිනිශ්චිතතාවක් පවතී.

ඒ අනුව ලැබිය යුතු රඳවාගැනීම් බදු මුදල වන රු 4,172,925 ට හිමිකම් පෑ නොහැකි බව අධ්‍යක්ෂ මණ්ඩලය නිගමනය කර ඇති 2019 පෙබරවාරි මස 13 වනදා පැවති විගණන කමිටුවේ නිර්දේශය සමග වසර හයක් සඳහා 2018 වසරේ සිට බලපැවැත්වෙන පරිදි මෙය ආදායම් ප්‍රකාශවලින් කපා හැරීමට තීරණය කර ඇත.

සටහන 09 - ශුද්ධ මූල්‍ය ආදායම

	රු	රු
මූල්‍ය ආදායම		
ස්ථාවර තැන්පතු පොළී ආදායම	**7,617,074**	6,572,439
අරමුදල් කළමනාකරණ ගිණුමේ පොළිය	**243,001**	68,239
	7,860,075	6,640,678
අඩු කළා මූල්‍ය පිරිවැය		
බැංකු අයිරා මත පොළිය	**-**	10,148
රාජ්‍ය ණය පොළිය	**56,108**	88,169
	56,108	98,317
	7,803,967	6,542,361

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය
අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07

අවසන් මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන් - 2018

සටහන 10 - ආදායම් බදු වියදම්

10.1. ජංගම බදු

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත හා පසුව එයට සිදු කරන ලද සංශෝධන ප්‍රකාරව අධ්‍යාපන සේවාවන් සපයනු ලබන ආයතනවල ලාභ සහ ආදායම සඳහා 10% ක අනුපාතයක් අදාළ වේ. අනෙකුත් ආදායම් මූලාශ්‍ර සඳහා එය 28% කි.

	2018	2017
	රු	රු
වර්තමාන වසරේ ලාභය සඳහා වන බද්ද(සටහන 10.2)	**-**	1,223,774
වසර තුළ ආපසු හරින ලද/ (හඳුනා ගන්නා ලද) විලම්භිත බදු	**(247,956)**	(122,345)
	(247,956)	1,101,429

10.2.ගිණුම්කරණ ලාභය හා බදු සඳහා ලාභය සැසඳීම

ආදායම් බදු වියදමට පෙර ගිණුම්කරණ ලාභය	**15,117,863**	14,119,033
සමස්ථ ප්‍රතික්ෂේපිත අයිතම ප්‍රමාණය	**1,747,348**	906,049
සමස්ථ අනුමත අයිතම ප්‍රමාණය	**(754,726)**	(799,150)
පොළී ආදායම	**(7,860,075)**	(6,640,678)
ව්‍යාපාරයේ බදු සඳහා ලාභය/ (අලාභය)	**8,250,410**	7,585,254
වෙනත් ව්‍යවස්ථාපිත ආදායම්	**16,110,485**	14,225,932
වසර තුළ සිදු වූ බදු අලාභය	**(16,110,484)**	(4,979,076)
බදු අය කළ හැකි ආදායම	**-**	9,246,856
ව්‍යාපාර ආදායම මත 14% ආදායම් බද්ද	**-**	758,525
ආයෝජන ආදායම මත 28% ආදායම් බද්ද	**-**	465,249
වර්තමාන වසරේ ආදායම මත බදු පැනවීම	**-**	1,223,774

10.3. බදු අලාභ සැසඳුම

ඉදිරියට ගෙන එන ලද බදු අලාභය	**105,315,098**	110,294,174
වසර තුළ භාවිතා කළ බදු අලාභය	**(16,110,485)**	(4,979,076)
CIF බදු අලාභය	**89,204,613**	105,315,098

11. කොටසක ඉපැයීම්/(අලාභය)

කොටසක ඉපයීම/ (අලාභය) ගණනය කරනුයේ සාමාන්‍ය කොටස්කරුවන්ට අදාළ වසර සඳහා වන බදු පසු ලාභය/ (අලාභය)වසර අවසාන වන විට සාමාන්‍ය කොටස්වලට අදාළ බර තැබූ සාමාන්‍යයෙන් බෙදීමෙනි.

	2018	2017
සාමාන්‍ය කොටස්කරුවන්ට අදාළ ලාභය/ (අලාභය)	**රු**	**රු**
සාමාන්‍ය කොටස්කරුවන්ට අදාළ බදු පසු ලාභය රු.	**15,365,819**	13,012,024
සාමාන්‍ය කොටස් ගණන		
වසර තුළ බර තැබූ සාමාන්‍ය කොටස් සාමාන්‍යය	**14,206,509**	14,206,509
කොටසක් සඳහා ඉපැයීම්/(අලාභය) (රු.)	**1.08**	0.92

දුරස්ථ ඉගෙනුම්මධ්‍යස්ථානය
අංක 28/10, මලලසේකරමාවත, කොළඹ 07

අවසන්මූල්‍යප්‍රකාශයපිළිබඳ සටහන්- 2018

සටහන 12 - දේපළ, පිරියත හාඋපකරණ

	Free Hold					
12.1 පිරිවැය	ලී බඩුහා උපකරණ	කාර්යාල උපකරණ	පරිගණක උපකරණ	මෝටර් රථ	පරතරයන්අවමකිරීමේ හාඉගැන්වීමේඋපකරණ	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.
2018ජනවාරි 1 දිනටශේෂය	4,666,634	3,079,828	39,915,561	152,040	6,104,142	53,918,205
වසර තුළඑකතු කිරීම්	20,000	39,250	671,873	-	-	731,122
වසර තුළඉවත්කිරීම්/(මාරුකිරීම්)	-	-	-	-	-	-
2018 දෙසැම්බර් 31 දිනටශේෂය	**4,686,634**	**3,119,078**	**40,587,434**	**152,040**	**6,104,142**	**54,649,327**
12.2 සමුච්චිත ක්ෂය/ ක්‍රමක්ෂය						
2017 ජනවාරි 1 දිනටශේෂය	3,946,627	2,734,782	39,358,825	124,568	6,104,141	52,268,943
වසරසඳහා ගාස්තුව	325,283	145,521	536,028	-	-	1,006,832
වසර තුළඉවත්කිරීම්/(මාරුකිරීම්)	-	-	-	-	-	-
2018 දෙසැම්බර් 31 දිනටශේෂය	**4,271,910**	**2,880,303**	**39,894,853**	**124,568**	**6,104,141**	**53,275,776**
2017 දෙසැම්බර් 31 දිනට	720,007	345,046	556,736	27,472	1	1,649,262
2018 දෙසැම්බර් 31 දිනට	**414,724**	**238,775**	**692,581**	**27,472**	**1**	**1,373,551**

සටහන 13 - බදු කුළිය

සමාගම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන බලධාරීන් සමග බදු ගිවිසුමක් අත්සන් කරන ලද අතර එහිදී බදු ගැනුම්කරු සමාගම විසින් ඉදි කරන ලද ගොඩනැගිල්ල බද්දට ගැනීමට එකඟ විය. මෙම පිරිවැය 2003 ජනවාරි 1 දිනෙන් ආරම්භ වී 2032 දෙසැම්බර් 31 දින දක්වා වන වසර 30ක කාලයක් සඳහා අත්තිකාරමක් ලෙස සැලකෙන අතර පසුගිය වසර 30 සඳහා වන කල්බදු අත්තිකාරම් ගෙවීම විස්තීරණ ආදායම ප්‍රකාශයේ ඇතුළත් කර ඇත. **කෙසේ වුවද බදු ගිවිසුම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර නොමැත.**

	2018	2017
	රු	රු
		Restated
කලින් ගෙවූ කුළිය	**49,651,765**	46,466,406
එකතු කළා - බදු වත්කම් පිරිවැයට ගැලපුම	**-**	3,185,359
	49,651,765	49,651,765
අඩු කළා: බදු කුළිය ලෙස කපා හරින ලද මුළු මුදල	**(24,825,885)**	(22,923,240)
වර්තමාන වසරේ බදු ක්‍රමක්ෂය	**(1,655,059)**	-
බදු වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සඳහා ගැලපුම	**-**	(1,902,645)
	23,170,821	24,825,880

සටහන 14 - විලම්බිත බදු පැනවීම

	Rs.	Rs.
වසර ආරම්භයේ දී	**7,382,742**	7,260,397
වසර සඳහා අය කිරීම/ (ආපසු හැරවීම)	**247,956**	122,345
වසර අවසානයේ දී	**7,630,698**	7,382,742

වත්කම්වලට අදාළ සමාගම් අගයන් හා මූල්‍ය වාර්තාකරණය සඳහා වන වගකීම් අතර තාවකාලික වෙනස්කම් ඇති කරමින් ශේෂ පත්‍ර වගකීම් ක්‍රමය යොදාගෙන විලම්බිත බදු සපයනු ලබන අතර බදු පැනවීම සඳහා යොදා ගැනෙන මුදල 28% අනුපාතය අනුව ගණනය කෙරේ.

වසර අවසානය වන විට විලම්බිත බදු වත්කම් පහත පරිදි වේ.

	2018		2017	
	තාවකාලික වෙනස	**බදු බලපෑම**	**තාවකාලික වෙනස**	**බදු බලපෑම**
	රු.	රු.	Rs.	Rs.
ඉදිරියට ගෙන එන ලද බදුඅලාභය	**25,325,013**	**7,091,003**	25,325,013	7,091,004
දේපළ, පිරියත හා උපකරණ	**(762,308)**	**(213,446)**	(240,951)	(67,466)
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම	**2,657,995**	**744,239**	1,282,875	359,205
	27,220,700	**7,621,796**	26,366,937	7,382,742

විලම්බිත බදු වත්කම් හඳුනා ගන්නා ලද්දේ වාර්තා කරන දිනට කළමනාකාරීත්වය විසින් ආදායම පිළිබඳ සිදු කරන ලද පුරෝකථනය මත පදනම්ව ආපසු හැරවීමට අපේක්ෂිත මට්ටමට ඉදිරියට ගෙන එන ලද බදු අලාභයට අදාළවයි.

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය
අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07

අවසන් මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන්- 2018

සටහන 15 - වෙළඳ හා වෙනත් ලැබීම්

	2018	2017
	රු	රු
වෙළඳ ලැබීම්	**5,437,818**	4,833,232
අත්තිකාරම් සහ පෙර ගෙවීම්	**1,619,101**	1,635,142
පොළී ලැබීම්	**2,048,899**	1,876,211
	9,105,818	8,344,585

සටහන 16 - වෙනත් මූල්‍ය වත්කම්

	රු	රු
සේවකයින්ට ලබා දෙන වැටුප් අත්තිකාරම්	**72,000**	72,000
උත්සව අත්තිකාරම් ගිණුම	**54,000**	54,000
කෙටිකාලීන ආයෝජන (16.1 සටහන)	**83,885,006**	68,720,070
	84,011,006	68,846,070

සටහන 16.1 - කෙටිකාලීන ආයෝජන

	රු	රු
ස්ථාවර තැන්පතු	**68,774,187**	61,987,684
අරමුදල් කළමනාකරණ ගිණුම	**15,110,819**	6,732,386
	83,885,006	68,720,070

සටහන 17 - අයකර ගත හැකි ජංගම බදු

	රු	රු
පොළී ආදායම මත ලැබිය යුතු රඳවාගැනීමේ බදු 2018	**466,140**	
ආදායම් බදු ස්වයං ඇගයීම් ගෙවීම්	**484,223**	-
ලැබිය යුතු ESC	**247,530**	-
ලැබිය යුතු බදු ශේෂ	**3,477,438**	4,172,925
	4,675,331	4,172,925

සටහන 18 - මුදල් සහ මුදල් හා සමාන දෑ

	රු	රු
ඵාසි සහගත ශේෂ		
අතැති මුදල	**25,000**	25,000
බැංකුවේ ඇති මුදල - ලංකා බැංකුව: ගිණුම් අංකය. 0002323189	**329,721**	423,790
	354,721	448,790

සටහන 19 - ප්‍රකාශිත ප්‍රාග්ධනය

	රු	රු
නිකුත් කරන ලද හා සම්පූර්ණයෙන් ගෙවන ලද (සාමාන්‍ය කොටස් 14,206,509)	**142,065,090**	142,065,090
	142,065,090	142,065,090

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය

අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07

අවසන් මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන්- 2018

සටහන 20 - පොළී සහිත ණය	**2018**	2017
	රු	රු
එක් වසරකින් පසු ගෙවිය හැකි		
රාජ්‍ය ණය (සටහන 20.1)	**-**	3,206,160
	-	3,206,160
එක් වසරකින් ගෙවිය හැකි		
රාජ්‍ය ණය (සටහන 20.1)	**3,206,160**	3,206,160
	3,206,160	3,206,160
	3,206,160	6,412,320

සටහන 20.1 - රාජ්‍ය ණය

	රු	රු
වසර ආරම්භයේ දී ශේෂය	**6,412,320**	9,618,480
වසර තුළ ගෙවන ලද වාරික	**(3,206,160)**	(3,206,160)
වසර අවසානයේ දී ශේෂය	**3,206,160**	6,412,320

සටහන 20.2 -

ශ්‍රී ලංකා රජය හා සමාගම අතර අත්සන් තැබුණු 2003 අප්‍රේල් 28 දිනැති අතිරේක බදු ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා රජයේ සම්පූර්ණ දායකත්වය රු. 174,126,602/- වූ අතර ඒ අතරින් රු. 142,065,000/- (ඇ.ඩො. මි. 1.5)ක ප්‍රමාණයක් ප්‍රකාශිත ප්‍රාග්ධනය ලෙස සලකන ලද අතර ඉතිරි රු. 32,061,602/- (ඇ.ඩො.338,524)ක ප්‍රමාණය 2009 දෙසැම්බර් මස සිට වසර 10ක කාලයක් තුළ නැවත ගෙවිය හැකි ණයක් ලෙස සලකන ලදී. ප්‍රකාශිත ප්‍රාග්ධනයට අදාළ මුළු දායකත්වයෙන් රු.මි. 26ක් 2004 දී භාණ්ඩාගාර ලේකම්ගේ නමට වන එකක් රු. 10/- ක් වන සම්පූර්ණයෙන් ගෙවන ලද සාමාන්‍ය කොටස් 2,600,000ක් බවට පරිවර්තනය කරන ලද අතර ඉතිරි රු. 116,065,000/- ක මුදල 2010 දී සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කරන ලදී.

සටහන 21 - සේවක ප්‍රතිලාභ

	2018	2017
	රු	රු
වසර ආරම්භයේ දී ශේෂය	**1,282,875**	1,282,875
වසර තුළ සපයන ලද ප්‍රතිපාදන/ (ආපසු හැරවීම)	**1,375,120**	-
වසර අවසානයේ දී ශේෂය	**2,657,995**	1,282,875

සටහන 22 - වෙළෙඳ හා වෙනත් ගෙවීම්

	රු	රු
වෙළඳ ගෙවීම්	**65,000**	65,000
උපචිත වියදම් (22.1 සටහන)	**3,692,738**	4,332,492
වෙනත් ජංගම වගකීම්	**7,150**	7,150
	3,764,888	4,404,642

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය
අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07

අවසන් මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන්- 2018

සටහන 22.1 - දෙසැම්බර් 31 දිනට උපචිත වියදම්

	2018	2017
	රු	රු
දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය මගින් පිරිනැමෙන වැඩසටහන් සඳහා වන පිරිවැය	**327,885**	1,508,345
කුලී පිරිවැය	**260,573**	355,338
වැඩසටහන් මුද්‍රණ පිරිවැය	**12,600**	-
වැඩසටහන් පිරිවැය	**-**	189,162
අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා වන වියදම්	**5,600**	40,870
වාහන කුළිය	**50,000**	50,000
ඉන්ධන දීමනාව	**25,500**	25,500
අතිකාල	**54,501**	50,102
පුවත්පත්	**3,260**	3,140
විදුලිය	**344,328**	361,038
ජලය	**5,184**	10,368
විකුණුම් කොමිස්	**48,191**	57,677
දිරි දීමනාව	**73,577**	86,515
ප්‍රවාහන දිරි දීමනාව	**466,565**	345,000
ප්‍රවාහන දීමනාව - සම්බන්ධීකාරක	**-**	19,500
පවිත්‍රතා ගාස්තු	**52,496**	51,025
පරිවර්තන ගාස්තු	**2,390**	46,137
දුරකථනය	**26,546**	23,347
උපකරණ නඩත්තුව	**-**	29,922
අන්තර්ජාල ගාස්තු	**67,054**	112,820
මුද්‍රණ කටයුතු හා ලිපි ද්‍රව්‍ය	**4,430**	81,725
වෘත්තීය ගාස්තු	**30,000**	50,000
සේවක අර්ථසාධක අරමුදල	**194,420**	167,620
සේවක භාරකාර අරමුදල	**29,163**	25,143
උපයන විට ගෙවීමේ බදු	**26,078**	63,109
මුද්දර ගාස්තු	**925**	825
ප්‍රෝත්සාහන අරමුදල සාමාන්‍ය කාර්ය මණ්ඩලය	**-**	3,425
විශේෂ ගෙවීම් / ප්‍රසාද දීමනා : සටහන 22.1.1	**858,500**	442,000
ජාතිය ගොඩනැගීමේ බද්ද	**127,346**	128,714
ESC	**89,271**	-
විගණන ගාස්තු	**213,900**	-
වැටුප්	**-**	4,125
ප්‍රවාහන	**620**	-
රඳවාගැනීමේ බදු	**20,438**	-

ඡායා පිටපත් යන්ත්‍ර කුළිය	**90,961**	-
ගොඩනැගිලි නඩත්තුව	**153,000**	-
උපකරණ නඩත්තුව	**25,337**	-
කාර්ය මණ්ඩල සුබ සාධනය	**2,100**	-
	3,692,738	4,332,492

සටහන 22.1.1 ප්‍රසාද දීමනා ප්‍රතිපාදනය

2017 සහ 2018 වසර සඳහා ප්‍රසාද දීමනා විශේෂ දීමනා ප්‍රතිපාදන පදනම් වන්නේ මණ්ඩලය විසින් අනුමත සූත්‍රය මතයි.

සටහන 23- ලැබුණු අත්තිකාරම්

	2018
	රු
Coreintegra Consulting Services පුද් සමාගම	**141,593**
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත	**2,862,757**
මිනිස්බල සහ රැකියා දෙපාර්තමේන්තුව	**107,500**
VC වැඩසටහන සඳහා ලැබුණු අත්තිකාරම්	**10,260**
	3,122,110

සටහන 24- සම්බන්ධිත පාර්ශ්ව ගණුදෙනු

වසර තුළ කිසිදු සම්බන්ධිත පාර්ශව ගණුදෙනුවක් සිදු වී නැත.

සටහන 24.1 - ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග සිදු කළ ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්හි (LKAS 24) "සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්"වලට අනුව ප්‍රධාන කළමනාකරුවන් යනු අස්ථිත්වයේ කටයුතු සැලසුම් කිරීම, මෙහෙයවීම හා පාලනය කිරීමේ බලය හා වගකීම හිමි පුද්ගලයන්වේ. අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ ප්‍රධාන කළමනාකරුවන් ලෙස හඳුනාගෙන ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගි වීම වෙනුවෙන් වන දීමනාව ලෙස රු. 640,000 ක මුදලක් සමාගමේ ප්‍රධාන කළමනාකරුවන් වෙත ගෙවන ලදී.

TIN : 134008989

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය
අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07

ආදායම් බදු ගණනය කිරීම
ඇගයීම් වසර: 2018 (31.12.2018 දිනෙන් අවසන් වූ)

	Rs.	Rs.
ගිණුම් අනුව ශුද්ධ ලාභය/(අලාභය)		**15,117,863**
අඩු කළා : පොළී ආදායම		**(7,860,075)**
		7,257,788
එකතු කළා : ඉඩ නොදෙන වියදම්		
වෙළෙඳ ප්‍රචාරණ	**2,500**	
බොල් සහ අඩමාණ ණය	**16,320**	
අපහායන ප්‍රතිපාදන	**695,488**	
ක්ෂය වීම්	**1,033,040**	**1,747,348**
අඩු කළා : ප්‍රාග්ධන දීමනා (සටහන අ)		**(754,726)**
ගැලපුම් කළ ව්‍යාපාර ලාභය		**8,250,410**
පොළී ආදායම		**7,860,075**
මුළු ව්‍යවස්ථාපිත ආදායම		**16,110,485**
ඉදිරියට ගෙන ආ ව්‍යාපාර පාඩු (මුදා නොහළ ව්‍යාපාර පාඩු)	**105,315,098**	
මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් හිමිකම් පෑ හැකි උපරිම 100%	**16,110,485**	**16,110,485**
ව්‍යාපාර පාඩු ඉ/ගෙ	**89,204,613**	
(උපරිම කාල සීමාව තවත් වසර 05 ක් පමණි) දේ.ආ. පනතේ 19 වන වගන්තිය		
බදු අයකළ හැකි ආදායම		**-**
ගෙවිය යුතු බදු 14%		**-**
ගෙවිය යුතු බදු 28%		**-**
මුළුගෙවිය යුතු බදු		**-**
බදු සහනය		
පොළී ස්ථාවර තැන්පතු මත		**466,140**
ස්වයං ඇගයුම් ගෙවීම් (සටහන ආ)		**484,223**
ලබාගත් ආදායම් බදු නැවත ගෙවීම		**950,363**

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය
අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07

බදු ගණනය සඳහා සටහන් -2018

සටහන අ - ප්‍රාග්ධන දීමනා

	Rs.
කාර්යාල උපකරණ	-
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	
රු 265,301/- @ 20% (5 වන වසර)	**53,060**
රු . 1,342,900/- @ 20% (4 වන වසර)	**268,580**
පරිගණක උපකරණ	
රු. 1,311,751/- @ 25% (4 වන වසර)	**327,938**
රු.30,709/-@ 25% (3 වන වසර)	**7,677**
රු.187,250/-@ 25% (4 වන වසර)	**46,813**
රු.7,000/- @ 25% (3 වන වසර)	**1,750**
රු.9,000/-@ 25% (3 වන වසර)	**2,250**
රු.65,000/-@ 25% (2 වන වසර)	**16,250**
මෝටර් වාහන	
රු. 152,040/- @ 20% (5 වන වසර)	**30,408**
	754,726

සටහන ආ - ස්වයං ඇගයුම් ගෙවීම්

දිනය	චෙක්පත් අංකය	මුදල
8/14/2018	11096	243,830.00
11/14/2018	11362	240,393.00
		484,223.00

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ කොටස්කරුවන්ගේ වාර්ෂිකා මහ සභා රැස්වීම 2019 මැයි 30 දින ප.ව.4.00ට කොළඹ 7 මළලසේකර මාවතේ, නො. 28/10 ලියාපදිංචි කාර්යාලයේ 4වන මහළෙහි දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

න්‍යාය පත්‍රය

1. රැස්වීම කැඳවීම පිළිබඳ දැන්වීම කියවීම
2. සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ විගණක වාර්තාව සමග 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන ගිණුම් වාර්තාව ලබා ගැනීම හා සලකා බැලීම.
3. සමාගමේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි 89 හා 90 වගන්ති ප්‍රකාරව මාරු ක්‍රමයට (rotation) විශ්‍රාම යන වසන්තා පෙරේරා මෙයනැවත තෝරා පත් කර ගැනීම.
4. සමාගමේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි 89 හා 90 වගන්ති ප්‍රකාරව මාරු ක්‍රමයට (rotation) විශ්‍රාම යන ෆයිසාල් සාලී මහතා නැවත තෝරා පත් කර ගැනීම.
5. 2007 අංක 07 දරන සමාගම් පනතේ 210 සහ 211 වගන්ති අනුව වයස අවුරුදු 70 සීමාවට ළඟා වූ ආචාර්ය එස්.ඒ.එම්. අබේරත්න මහතා දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස නැවත පත් කරගැනීම.
6. මීළඟ වසර සඳහා සමාගමෙහි විගණකයන් නැවත පත් කිරීම.

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථාන අධ්‍යක්ෂ මණ්ඩලයේ
නියමය පරිදි
Accounting Systems Secretarial Services
(Private) Limited PV 4190

.....
අධ්‍යක්ෂ/ ලේකම්

2019 මැයි 17

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය

පෙරකලාසි ආකෘතිය

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ කොටස්කරුවකු/ කොටස්කරුවන් වන ..... හි ..... වන මම/ අපි ..... හි ..... හෝ ඔහුට/ ඇයට නොහැකි අවස්ථාවක දී,

කොළඹ වසන්තා පෙරේරා මෙය හෝ ඇයට නොහැකි අවස්ථාවක
කොළඹ සූරියහෙට්ටි අධිකාරි මුදියන්සේලාගේ අබේරත්න මයා හෝ ඔහුට නොහැකි අවස්ථාවක
කොළඹ මොහොමඩ් ඔස්මාන් ෆයිසාල් සාලී මයාහෝ ඔහුට නොහැකි අවස්ථාවක
කොළඹ කල්‍යාණී ගුණතිලක මෙය හෝ ඇයට නොහැකි අවස්ථාවක
කොළඹ අලිකී ඉස්මයිල් මෙය හෝ ඇයට නොහැකි අවස්ථාවක
කොළඹ කේ.ඒ.රම්‍යා කාන්ති මෙය හෝ ඇයට නොහැකි අවස්ථාවක

2019 මැයි 30 වන අඟහරුවාදා ප.ව.4.00 ට පැවැත්වීමට නියමිත සමාගමේ වාර්ෂික මහ සභා රැස්වීමෙහි දී සහ එහි කල්තැබුණු රැස්වීමක දී සහ එයින්මා මතු පවත්වන ඡන්දයක දී මා/ අප වෙනුවෙන් මා/අප සඳහා මාගේ/අපගේ නියෝජිතයා ලෙස මෙයින් පත් කරමි/ කරමු.

.....
කොටස්කරුවාගේ අත්සන
2019 ..... දින අත්සන් තබන ලදී.

පෙරකලාසි ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස්.

1. තමන් වෙනුවෙන් සහභාගි වීම හා ඡන්දය පාවිච්චි කිරීම සඳහා පෙරකලාසිකරුවකු පත් කිරීමට සාමාජිකයකුහට හිමිකම ඇත.
2. පෙරකලාසිකරුවකු සමාගමේ සාමාජිකයකු වීම අවශ්‍ය නොවේ.
3. රැස්වීමෙහි දී පෙරකලාසිකරුවකු මගින් ඡන්දය භාවිතා කිරීමට අවශ්‍ය සාමාජිකයකුට මෙහි දැක්වෙන ආකෘති පත්‍රය භාවිතා කළ හැකි අතර එයට "කථා කිරීමේ අයිතිය" ඇතුළත් කළ හැකිය.
4. වලංගුභාවය සඳහා සම්පූර්ණ කරන ලද පෙරකලාසි ආකෘති පත්‍රය රැස්වීමට පැය 48කට නොඅඩු කාලයකට පෙර සමාගමේ ලියාපදිංචි කරන ලද කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.
5. සමාගමක/ සංස්ථාවක පෙරකලාසිය එහි පොදු මුද්‍රාව යටතේ විය යුතු අතර එය මේ සමග යා කර එහි ව්‍යවස්ථා මගින් දක්වා ඇති ආකාරයට සහතික කර තිබිය යුතුය.